# නියමුවා

"අපි ප්‍රතිසංස්කරණවාදය දක්වා පහත නොවැටිය යුත්තෙමු. අප සටන් කරන්නේ පරාජය වීමට නොව, ජය ගැනීමටය. තත්වය ඉතාමත් නරක වුවත්, යටත් පිරිසෙයින් අර්ධ සාර්ථකත්වයක්වත් අපි අපේක්ෂා කරන්නෙමු. අප පරාජය වුවත්, අපි අර්ධ සාර්ථකත්වයක් අත් කර ගන්නෙමු. අපි ප්‍රතිසංස්කරණ දිනා ගන්නෙමු. ප්‍රතිසංස්කරණ පංති අරගලයේ උපකරණයකි."

**ලෙනින්**

තෝරා ගත් කෘති, වෙළුම 05, පිටුව 95

ISSN 1391 - 1031 | 2022 මාර්තු | 26 වෙළුම | 11 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 40/=



තංගල්ල ජනබල රැලිය 2022.02.26

# තෙල්-විදුලි අර්බුදයෙන් රටම අඩපණයි

## ජන පීඩක ආණ්ඩුවට එරෙහිව පෙළගැසෙමු

**ජන ජීවිතයේ සියලු අංශවලට බලපාන තෙල් හා විදුලි බලශක්ති අර්බුදය හේතුවෙන් රටේ ජනතාවගේ ජීවිත මුළුමනින්ම අවුල් ජාලාවක් බවට තිබීමත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා සහ ඔහුගේ ආණ්ඩුව මෙම ගැටලු විසඳීමට මුළුමනින්ම අසමත් වීමත් හමුවේ, ලැබෙන පළමු මොහොතේම මෙම ජන පීඩක ආණ්ඩුව පළවා හැරීමට ජනතාව විසින් පියවර ගත යුතුව ඇතැයි ජනතා විමුක්ති පෙරමුණ ජනතාවට අවධාරණය කරයි.**

රට තුළ ප්‍රමාණවත් තෙල් සංචිත නොමැති අතර ආහාර, ඖෂධ, ඉන්ධන ඇතුළු පරිභෝජන ද්‍රව්‍ය ආනයනය සඳහා විදෙස් සංචිත ප්‍රමාණවත් නොවේ. මේ තත්වය තුළ දෛනික විදුලි නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් ඉන්ධන නිකුත් කිරීමේ හැකියාවක් නොමැති වීම හේතුවෙන් ක්‍රමයෙන් විදුලිය කප්පාදු කෙරෙන කාල සීමාව පැය 07කට වඩා වැඩි වෙමින් තිබේ. පිරවුම්හල්වල නිතර ඉන්ධන හිඟවීම හේතුවෙන් ජනතාවගේ අත්‍යාවශ්‍ය ගමන් බිමන්වලට අදාළ පෞද්ගලික සහ පොදු ප්‍රවාහන සේවා බිඳවැටෙමින් ඇති අතර විදුලිය කප්පාදු කිරීම හේතුවෙන් කර්මාන්ත, ව්‍යාපාරික කටයුතු, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු මෙන්ම ආහාර පිළියෙළ කිරීම ඇතුළු ජන ජීවිතයේ ගෘහස්ථ කටයුතු අකර්මණ්‍ය වෙමින් ඇත.


මේ පිළිබඳව නියමුවා වෙත අදහස් දැක්වූ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ආණ්ඩුව සතුව ජනතාව පෙළන කිසිදු ගැටලුවකට විසඳුම් නොමැති බවත් ආණ්ඩුවේ ඇමතිවරුන් මේ අසමත්භාවයේ වගකීම එකිනෙකා වෙත තල්ලු කර වගකීමෙන් මිදීමට උත්සාහ දරමින් සිටින බවත් ලැබෙන පළමු මොහොතේම මෙම ජන පීඩක ආණ්ඩුව පළවා හැරීමට ජනතාව විසින් පියවර ගත යුතුව තිබෙන බවත් අවධාරණය කළේය. එසේම ආණ්ඩුව පෙරළා දමා අවුරුදු හැත්තෑහතරක් පුරා රටේ අනාගතය විනාශ කළ මෙවැනි වර්ගයේම ආණ්ඩු නැවත පත් කර >>02 වැනි පිටුවට

### 03 අර්බුදය හමුවේ...




දැන් සිදුව ඇත්තේ කුමක් ද? රට මුහුණදී ඇති බරපතළ මූල්‍ය අර්බුදය හමුවේ අසීමිත බලය, තුනෙන් දෙකේ බලය 'යුද්දෙට නැති කඩුව' බවට පත්ව හමාරය.....

### 05 ඉතිහාසයේ රෝදය කැරකෙන්නේ...



ලස්සන ජීවිතයක් සුන්දර රටක් පැහැබර අනාගතයක් ප්‍රාර්ථනා කරන හැමදෙනාටම අප සමග අත්වැල් බැඳගන්නා ලෙස අපි ආරාධනා කරනවා...

### 07 අඳුරේ ගිලෙන ආර්ථිකය...



ඇමතිවරුන්ගේ විකාර විහිළු කතා නොව අර්බුදයට එක් ප්‍රධාන හේතුවක් වනුයේ, ආදායම ඉක්මවන දෙගුණයක් පමණ වන වියදම වැඩිවීමය. එක්කෝ ආදායම ඉහළ දැමීමට සැලැස්මක් අවශ්‍යය. ...

තරුණ.................................. 04
විශේෂ.................................. 06
කාන්තා.................................. 08
වේදිකාව .............................. 09
විශේෂාංග.......................... 10
ඉතිරි .................................. 11

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## සේවක සටන හමුවේ අධිභාර පනත හකුළා ගනී




EPF-ETF අරමුදල් මත 25%ක අධිභාර බද්දක් අය කිරීම වෙනුවෙන් ආණ්ඩුව විසින් යෝජනා කර ඇති පනතට එරෙහිව රටපුරා ආරම්භ කරන ලද විරෝධතා ක්‍රියාමාර්ග හේතුවෙන් අධිභාර පනත ආණ්ඩුව විසින් හකුළා ගත් බව අන්තර් සමාගම් සේවක සංගමයේ ලේකම් නීතීඥ ජානක අධිකාරී සහෝදරයා මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළේය.

නීතීඥ ජානක අධිකාරී සහෝදරයා පැවසුවේ රටේ ලක්ෂ 26ක පෞද්ගලික අංශ සේවකයින් පෙළගස්වමින් ආණ්ඩුව ගෙදර යවන දැවැන්ත සටනක් කිරීමට අන්තර් සමාගම් සේවක සංගමය සූදානම් වූ බවය. 2011දී විශ්‍රාම වැටුප් පනතක් ගෙන එමින් සේවක අරමුදල් කොල්ලකෑමට ගත් උත්සාහයේදී ජීවිත පූදකරමින් මෙම අරමුදල රැක ගැනීමට කටයුතු කළ ආකාරයටම මෙම පනත හකුළා නොගන්නේ නම් ආණ්ඩුව ගෙදර යවන සටන මේ සියලු සේවකයින් සමග අරඹන බවත් ඔහු පැවසීය. වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු ගාමිණී රත්නායක සහෝදරයා මෙහිදී පැවසුවේ ඉදිරියේදී මෙම අධිභාර පනත මෙම අරමුදල්වලින් ඉවත් කළ බවට ලිඛිත ප්‍රකාශයක් මුදල් ඇමතිවරයා විසින් ඉදිරිපත් කළ යුතු බවය.

අධිභාර පනතට එරෙහිව කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරිපිටදී අන්තර් සමාගම් සේවක සංගමයේ මූලිකත්වයෙන් දැවැන්ත උද්ඝෝෂණයක් පවත් වන ලද අතර ඉන්පසු රටපුරා පෞද්ගලික අංශයේ ආයතන ඉදිරිපිට විරෝධතා උද්ඝෝෂණ පැවැත්විණි. එසේම විරෝධතා බැනර් ප්‍රදර්ශනය කිරීම් ඇතුළු ක්‍රියාමාර්ග ගණනාවක් අන්තර් සමාගම් සේවක සංගමයේ මූලිකත්වයෙන් සිදු විය.

## අධ්‍යාපන සමුපකාරය දැඩි දූෂිත පාලනයක සේවකයෝ කොමිෂන් සභාව වටලති



කොල්ලුපිටිය අධ්‍යාපන සමුපකාර සේවකයින්ගේ රු. 10,000 දීමනාව ලබා දීමට සමුපකාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොදීමට එරෙහිව අධ්‍යාපන සමුපකාර සේවකයින් අරඹා ඇති විරෝධතා ක්‍රියාමාර්ග තීව්‍ර කිරීමට කටයුතු කොට ඇත. ඒ අනුව පසුගියදා සේවකයින් විසින් කොල්ලුපිටිය අධ්‍යාපන සමුපකාර අධ්‍යක්ෂක මණ්ඩලය වටලමින් තම ඉල්ලීම්වලට විසඳුම් ලබාදෙන ලෙස බල කළ අතර එහිදී ආයතන සභාපතිවරයා, ලේකම්, උපලේකම්වරයා පොලීසිය ගෙන්වාගෙන පලා යන ලදී. එසේම එදිනම නැවත වරක් සතියක වැඩවර්ජනයක් කැඳවීමට කටයුතු කළ අතර එහිදී සමුපකාර පාලනය ඉතා දූෂිත මට්ටමින් කටයුතු කරමින් සිටින බව අධ්‍යාපන සමුපකාර වෘත්තීය සමිති එකමුතුව වෙනුවෙන් නන්දන හේවගේ සහෝදරයා පැවසීය.

ඉන් පසුව රු. 10,000 දීමනාව ලබා නොදීම පිළිබඳ සමුපකාර දෙපාර්තමේන්තුවේ තීරණයත් සමග නැවත වරක් සියලු සේවකයින් සමුපකාර අමාත්‍යාංශයේ සිට සේවක කොමිෂන් සභාව වෙත උද්ඝෝෂණ පෙළපාලියකින් පැමිණි අතර එහිදී සමුපකාර සේවක කොමිෂන් සභාව තුළදී විරෝධතාවයක් පැවැත්විණි. ඉන් අනතුරුව සේවක කොමිෂන් සභාවේ සභාපතිනිය සමග පැවති සාකච්ඡාවකින් පසු ඉදිරි දින කිහිපය තුළදී සමුපකාර ඇමතිවරයා සමග සාකච්ඡාවක් ලබාදෙන බවට වූ එකඟතාවයෙන් උද්ඝෝෂණය අවසන් කළ බව මෙහිදී අධ්‍යාපන සමුපකාර වෘත්තීය සමිති එකමුතුව වෙනුවෙන් නන්දන හේවගේ සහෝදරයා පැවසීය.

## සෞඛ්‍ය ගැටලුවලට විසඳුම් ඉල්ලා වෛද්‍යවරු ක්‍රියාමාර්ගවලට




සෞඛ්‍ය සේවය තුළ පවතින ගැටලු ගණනාවක් විසඳීමට බලකරමින් සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමය වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා බව එහි ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පැවසීය. ඒ අනුව සෞඛ්‍ය සේවාව වෙනුවෙන් දළ ජාතික නිෂ්පාදිතයෙන් 5% ක් වෙන්කිරීම, අපේ රටේ සෞඛ්‍ය සේවාවේ නායකත්වයේ සහ කළමනාකාරිත්වයේ අඩුපාඩු, උග්‍ර මානව සම්පත් හා භෞතික සම්පත් හිඟය යන ප්‍රධාන කරුණු තුනට විසඳුම් ලබාදෙන ලෙස බලකරමින් මෙම ක්‍රියාමාර්ග ආරම්භ කරන බව ඔහු පැවසුවේ මාධ්‍ය හමුවක් අමතමිනි.

පසුගිය අවුරුදු 20 ක කාලය තුළදීම සෞඛ්‍ය සේවය සඳහා 1-1.9% ත් අතර ප්‍රමාණයක් පමණක් රජය මගින් සෞඛ්‍ය සේවය සඳහා වෙන් කර ඇති නමුත් එය කෙසේවත් ප්‍රමාණවත් නොවන බව වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා මෙහිදී අවධාරණය කළේය. එසේම සියලු සෞඛ්‍ය සේවකයින් විශාල කැපකිරීම් කරමින් කටයුතු කළද සෞඛ්‍ය සේවකයාට තෘප්තිමත් සේවයක් කළ නොහැකි බවත් සේවක හිඟය නිසා විශාල ලෙස අතිකාල සේවයේ නිරත වීමට සිදු වී ඇති බවත් පෙන්වා දුන් ඔහු කෙසේ නමුත් එයට ප්‍රමාණවත් දීමනා ලබාදීමක් සිදු නොවන බව පැවසීය.

ඒ අනුව ඉදිරියේදී ඒ සඳහා සේවක දැනුවත් කිරීම්, පෝස්ටර් ප්‍රදර්ශනය ආදී ලෙස මෙම ඉල්ලීම් ජයග්‍රහණය තෙක් ක්‍රියාමාර්ග ගන්නා බවද ඔහු මෙම මාධ්‍ය හමුවේදී පැවසීය.

## රු. 5000/- දීමනාව ලබාදෙනු! ඉංජිනේරු සංස්ථා සේවකයෝ උද්ඝෝෂණයක




රු. 5000/- දීමනාව වහා ලබාදෙනු, EPF මුදල් බැර කිරීම විධිමත් කරනු, ඉතිරි කරගත් විවේක නිවාඩු අහෝසි නොකරනු යන ප්‍රධාන ඉල්ලීම් ලබාදෙන ලෙස බලකරමින් ඉංජිනේරු සංස්ථා වෘත්තීය සමිති එකමුතුව මගින් කොම්පඤ්ඤවීදිය ඉංජිනේරු සංස්ථා ප්‍රධාන කාර්යාලය ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්වීය.

පෙබරවාරි මාසයට ලැබිය යුතු රු. 5000/- දීමනාව මේ දක්වා ලබා නොදුන් බවත් ඉංජිනේරු සංස්ථාව සඳහා මහා භාණ්ඩාගාරය මගින් මුදල් ලබාදී නොමැති බවත් එසේම 2012 සිට උසස්වීම් නොමැති බවත් ආයතනයට අවශ්‍ය කරන තාක්ෂණ නිලධාරීන් නොමැති බවත්, පරිපාලනය විසින් දේශපාලන වුවමානවන් මත නිලධාරීන් බඳවා ගනිමින් හා වෘත්තීය සමිති නායකයින් මර්දනය කිරීමට කටයුතු කරමින් සිටින බවත් පාලකයින්ගේ මෙම සියලු ක්‍රියාමාර්ගවලට විරෝධය දක්වන බවත් මෙම උද්ඝෝෂණයේදී මංජුල සිරිසෝම සහෝදරයා පැවසීය.

# මේ පෙළගැසෙමින් තිබෙන්නේ රට අලුත් පරිවර්තනයකට ගෙන යන ජනතා බලයයි

### ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා



ජනතාවගේ ජීවිත උසස් කරවීම සඳහා යෙදවිය යුතුව තිබූ ධනය මජර පවුල් කිහිපයක් විසින් හොරකම් කර ඇති බවත් එම ධනය නැවත අත්පත් කර ගත යුතුව ඇති බවත් මේ තත්වය තුළ මහින්ද, ගෝඨාභය මෙන්ම සජිතුත් කලබල විය යුතුව ඇති බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා, කෙසේ වුවද ජාතික ජන බලවේගය පියවරෙන් පියවර පෙළගස්වමින් තිබෙන්නේ රට අලුත් පරිවර්තනයකට ගෙන යන ජනතා බලය බවත් තංගල්ල නගරයේ රැව්දෙන්නේ ඒ මහා ජනතා බලය බවත් අවධාරණය කර සිටියේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 26වැනි දින පස්වරුවේ තංගල්ල නගරයේ පැවති ජාතික ජන බලවේගයේ ජන බල රැලිය අමතමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

" මෙච්චර කල් මහජනයාගේ ධනය ප්‍රකෝටි ගණන් හොරකම් කළ ආණ්ඩු හැදුණේ. අපි හදන්න ඕනෑ මහජන මුදල් ශතයක් සොරකම් නොකරන ශතයක්වත් නාස්ති නොකරන පාලනයක්. මම පාර්ලිමේන්තුවේදී කියන කරන ප්‍රකාශ ගැන සමහර අය කියනවා නඩුවලින් බේරෙන්න පාර්ලිමේන්තුවේදී විතරක් කියන බව. ඒ නිසා මහින්ද මහත්තයාගේ ගෙදර ළඟටම ඇවිල්ලා මේ කතාව කියන්නේ. 2015දී මැතිවරණ ව්‍යාපාරයට චීන සමාගම්වලින් ඩොලර් මිලියන හය හමාරක් දුන්නා කියලා. පාර්ලිමේන්තුවේදී මේ ගැන කීවාම ඔළුව වනනවා. ජොන්ස්ටන් දවසක් නැගිටලා මට දූෂිතයන්ට දඬුවම්දීමේ බලයක් තිබුණු බව කීවා. මම නැගිටලා කීවේ මට එවැනි බලයක් තිබුණා නම්, ඉස්සරහා පේලියේ කවුරුත් නැහැ කියලා. ඒ වගේ කියන්න පුළුවන්නේ ජාතික ජන බලවේගයේ අයට විතරයි. ඒ වගේ දූෂණයෙන් තොර ආණ්ඩුවක් මේ රටට ඕනෑ. තංගල්ල නගරයට රැස්වෙලා ඉන්න දස දහස් සංඛ්‍යාත අම්මලා තාත්තලාට අපි ආරාධනා කරන්නේ වංචාවෙන් දූෂණයෙන් තොර පාලනයක් ගොඩනැගීමට කැපවෙන්න කියලයි.

අද අපේ රටේ දේශපාලනය සම්බන්ධ නඩු පිළිබඳව විශාල සැකයක් ඇතිවී තිබෙනවා. බැසිල්ගේ මල්වානේ නඩුව ගම්පහ අධිකරණයේ තිබෙනවා. ඒ ගැන සැකයක් තිබෙනවා. අද අපේ රටට ඕනෑ තමන්ගේ තනතුරේ ගරුත්වයත් එක්ක නීතිය ඉටුකරන්න පුළුවන් රටක්. අපේ පොලිසියේ මහත්වරුන්ට තමන්ගේ හැකියාව, දැනුම අනුව උසස්වීම් ලබාදෙන ක්‍රියාමාර්ගයක් තහවුරු කරන්න ඕනෑ. මේ ප්‍රදේශය භාර එච්.කියු.අයි මහත්තයා අපේ ස්පීකර් කිහිපයක වයර් කපන්න නියෝග කරලා. හැබැයි අපේ පාලනයක් යටතේ තමන්ගේත් අනුන්ගේත් ගරුත්වය තනතුරේ ගරුත්වය ආරක්ෂා කරන්න පුළුවන් සාධාරණව නීතිය ක්‍රියාත්මක වන රටක් ගොඩනගනවා. මේ ගොල්ලන්ට ඒක කරන්න බැහැ. ගම්පහ අපේ රැස්වීමකට පසුගියදා බිත්තර ගැහුවා. ගෝඨාභය පවු. ඒකට ආපු දෙන්නෙක් අල්ලාගෙන පොලිසියට භාර දුන්නා. පොලිසියෙන් ඒ අය ඉස්පිරිතාලයට දාලා ගෙදර යැව්වා. ඒ පොලීසියේම අය අපිට කතා කරලා ඒ බව දැනුම් දුන්නා. නීතියේ සාධාරණය ඉටුකරන්න බලයක් පොලිස් දෙපාර්තමේන්තුවට අද නැහැ. චමුදිත සමරවික්‍රමගේ ගෙදරට අසූචි ප්‍රහාර, ගල් ප්‍රහාර එල්ල කර, බිය වැද්දීමකට ලක්කලා. කැමරා 21කින් ගත්ත වීඩියෝ දර්ශන ලබාදුන් බව චමුදිත කියනවා. වාහන අංකයත් තියෙනවා. ඒත් ගහපු කෙනෙක් නැහැ.

පාස්කු ප්‍රහාරය පිළිබඳව අලගිය මුලගිය තැන් ගැන විශාල තොරතුරු ප්‍රමාණයක් හිටපු පොලිස් අධිකාරී ශානී අබේසේකර ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සමේ සඳහන් කර තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සොයා ගත් තොරතුරු ඒවා. අපේ රටේ විශාල අපරාධකරුවන් පිරිසක් දේශපාලන ශක්තිය මත සැඟවී සිටිනවා. අපි ඉස්සරහා තිබෙන මේ රට වෙනස් කර නීතියේ විධානය ආධිපත්‍යය සහිත රටක් ගොඩනැගීමටයි අපි ආණ්ඩුවක් හදන්න ඕනෑ.

මේ අපරාධ පසුබිම යටතේ අපේ රටේ ආර්ථිකයේ මුදුනටම හෙන ගහලා තිබෙන්නේ. ජනවාරි මාසයේ ආහාර පානවල උද්ධමනය ජනවාරි මාසයේදී 20% ඉක්මවලා කියලා ආණ්ඩුවේ වාර්තාවලම කියනවා. අපේ රටේ ජනතාවගේ ජන ජීවිතය උසස් කිරීමට පවතින සම්පත් යොදවා ගන්න ඕනෑ. ලෝක වෙළඳපොළේ පංගුවක් අත්පත් කර ගන්න අපි ක්‍රියාකරන්න ඕනෑ. යුද්දයෙන් පස්සේ අපේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් කළ හැකි වටපිටාවක් නිර්මාණය වුණා. අද අපේ රටේ ආර්ථික ප්‍රශ්නයට හේතුව කොරෝනා බව කියනවා. හැබැයි බංගලිදේශයට, ඉන්දියාවට, වියට්නාමයට, මැලේසියාවට කොරෝනා බලපෑවේ නැද්ද? ඒ රටවල්වල විදෙස් සංචිත වැඩිවුණා. හේතුව කොරෝනාද? කොරෝනා වෛරසය අවුරුදු දෙකයි. හැබැයි නිල් පාට, කොල පාට අවුරුදු 73ක වෛරසයක් තිබෙනවා. අපේ රට හපයක් බවට පත් කළේ මේ වෛරස් දෙක විසින්. රට මේ තත්වය පත්කර හම්බ කළ ධනය ඒ ගොල්ලෝ ළඟ තිබෙනවා. කළු ධනය එක්රැස් කරගත් ව්‍යාපාරිකයෝ, මාධ්‍ය බලය ඔවුන්ට තිබෙනවා. අපි සතුරාව අවතක්සේරු 11 පිටුවට

## තෙල්-විදුලි අර්බුදයෙන්... 01 පිටුවෙන්..

නොගැනීමට ජනතාව පරෙස්සම් විය යුතු බව පෙන්වා දුන් විජිත හේරත් සහෝදරයා, රටට ගැඹුරු සමාජ ආර්ථික පරිවර්තනයක් අවශ්‍ය වී ඇති බවත් ඔළුගෙඩි මාරුවකින් හෝ රටට අත්වී ඇති විනාශයට හවුල් වූ පක්ෂ බලයට පත්කිරීමෙන් පවතින අර්බුදයට විසඳුම් අපේක්ෂා කළ නොහැකි බව ප්‍රකාශ කළේය.

"ජාතික ජන බලවේගය පිහිටුවා තිබෙන්නේ ජනතාව පෙළන මේ සකල විධ අර්බුදයන්ට විසඳුමේ මාවත පෙන්වන බලවේගයක් ලෙසයි. ජනතා ගැටලුවලට විසඳුම් රැගෙන එන සහ ජනතාවට නව ජීවිතයක් ලබා දෙන නව පන්නයේ ආණ්ඩුවක් පිහිටුවීමට අපි බලපොරොත්තු වෙනවා. ඒ සඳහා වන දේශපාලන ගමන වෙනුවෙන් අපි සැලසුම් සකස් කර තිබෙනවා. මේ ගමන ජයග්‍රහණයෙන් කෙළවර කළ හැකියි. එසේම එය කළ යුතුයි. රටටත් ජනතාවට ආදරය කරන සියලු දෙනාට ආරාධනා කරන්නේ, රටේ සියලු දෙනාට සතුටින් සමගියෙන් ජීවත් විය හැකි සුන්දර රටක් නිර්මාණය කිරීම සඳහා ජාතික ජන බලවේගය සමග අත්වැල් බැඳගන්නා ලෙසයි." විජිත හේරත් සහෝදරයා වැඩිදුරටත් කියා සිටියේය.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# මේවා රටට හොඳ පාඩම්

සිදුවීම් සිදුවන්නේ හඬා වැලපීමටවත්, කොක් හඬලා සිනාසීමටවත් නොව පාඩම් ඉගෙන ගැනීමට යැයි වරක් ස්පිනෝසා නම් දාර්ශනිකයා පවසා තිබුණි. මෙම කියමන වඩාත් වටින්නේ අද අපේ රටේ ජනතාවටය.

එසේම වළක වැටීම මොළයට ලාභයක් යැයි වරක් පවසා තිබුණේ මාවෝ සේතුංය.

අපේ රටේ පොදු ජනතාව දැන්වත් අතීතයෙන්, භාවිතාවෙන් පාඩම් උගත යුතුය. නැතිනම් අප ඉදිරිපිට, රට ඉදිරිපිට නිර්මාණය වෙමින් තිබෙන මේ ව්‍යසනයෙන් ගැලවීමට හැකි වන්නේ නැත. වසර 74ක් පුරාවට ප්‍රභූ පැලැන්තියේ වලව්කාර පවුල් කිහිපයකට මෙරට පාලනය ලබාදී ඔවුන්ගෙන් පාරාදීසයක් බලාපොරොත්තු වූ පොදු ජනතාවෝ අද මරුකතරක අතරමංව සිටිති. අපට අස්වනු ලෙස ලැබෙන්නේ අප වැපිරූ දේ පමණක් බවත් බජිරි වපුරා බාස්මතී බලාපොරොත්තුවීම නිෂ්ඵල බවත් දැන්වත් ජනතාව තේරුම් ගත යුතුය.

විවිධ හේතු මත, පෞද්ගලික අපේක්ෂා මත, හොඳ දෙයක් වේ යැයි කළ උපකල්පන මත, අතීතයේදී ආණ්ඩු හැදීමට කළ දේශපාලනය ගැන, කිසිවෙකු දෝෂ දර්ශනයට ලක්විය යුතු නැත. එහෙත් එහි අසාර්ථකත්වය හා වැරදි සහගත බව පිළිබඳව මෙතරම් පාඩම් හා අත්දැකීම් තිබියදී නැවතත් එම මඟම යමින්, එම වරදම කරන්නේ නම් ඉතිහාසය ඊට කිසි දිනෙක සමාව නොදෙනු ඇත. ඒ වෙනුවෙන් දඬුවම් ලෙස මීටත් වඩා බරපතළ ව්‍යසනවලින් පීඩාවට පත්වීමට සිදුවන්නේ පොදු ජනතාවටමය. දැන්ම අලුතින් සිතිය යුතු වන්නේ මේ නිසාය.

ගෝඨාභය රාජපක්ෂ ඇතුළු පිරිසට ජනතාව බලය දුන්නේ අවසාන වශයෙන් විශ්වාස කළ හැකි නායකයා ඔහු බව සිතමිනි. රට බේරා ගැනීමේ අවසන් අවස්ථාව එය බව කියමිනි. ඒ සඳහා විශාල බලයක් ඔවුන් ඉල්ලූ විට ජනතාව විපක්ෂයකට ඉඩ නොතබාම ලෝභ නැතිවම එම බලය රාජපක්ෂවරුන්ට දුන්නේ රට හැදීමට 'වැඩි බලයක්' අවශ්‍යය යන මිථ්‍යාව විශ්වාස කරමිනි. එහෙත් දැන් එහි සැබෑ තත්වය ජනතාව  තේරුම් ගනිමින් සිටින බව පෙනේ.

තුනෙන් දෙකේ ආණ්ඩුවක් හා සියලු බලය සහිත, එනම් 'සර්වබලධාරී' විධායක ජනාධිපති බලයක් සහිත ගෝඨාභය රාජපක්ෂ මහතාට වත්මන් අර්බුදය හමුවේ සිදුවී ඇත්තේ කුමක්ද? ඒ කිසිවක් තේරුම් ගත නොහැකි තත්වයට පත්වීමය.

බඩු මිල අඛණ්ඩව වැඩිවන විට විධායක බලයෙන් බඩු මිල පාලනය කළ නොහැකි බව ජනාධිපතිවරයා රටට පෙන්වා දුන්නේ එතෙක් පැවති මිල පාලනයද අතහැර දමමිනි. දැන් මිල පාලනයක් නැත. රට පාලනයක්ද නැත.

තෙල් මිලදී ගැනීමට නොහැකි මට්ටමට විදේශ විනිමය හිඟවී, තෙල් හිඟවී පෝලිම් හැදෙන විට තෙල් නැතිකමද හේතුවක් වී දිනපතා විදුලිය කපන විට, විධායක බලයට ඊට විසඳුම් ලබාදිය නොහැකි බව ජනාධිපතිවරයා පෙන්වමින් සිටී. 'විධායක බලයට' හිඟයකින් තොරව ඉන්ධන ලබාදිය නොහැකි බව, විදුලිය කැපීම නවතාලිය නොහැකි බව දැන් පැහැදිලිය.

ජනතාවගෙන් ලබාගත් අසීමිත බලයට කළ හැක්කේ කුමක්ද? මුහුණු පොතට යමක් ලියූ තරුණයෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම, මිරිහාන ප්‍රදේශයේ කඩයක් වැසීම, සමුළුවකට බිත්තර ගැසූ උන් පොලිසියෙන් බේරා ගැනීම වැනි දේ හැර රටට වැදගත් කිසිවක් කිරීමට ජනාධිපතිට ජනතාව දුන් 'බලය' අසමත්ව තිබේ.

අපේ ජනතාව මින් උගත යුත්තේ කුමක්ද? කිසියම් පාලකයෙකුට හෝ පාලක කණ්ඩායමකට 'මහා බලය' අවශ්‍ය වන්නේ රට හැදීමට නොව ජනතා විරෝධය මැද තම පැවැත්ම රැක ගැනීමටය. රටක් හැදීමට අවශ්‍ය වන්නේ 'විධායක බලය' නොව ජනතා බලයයි. ලොව පුරාම, ඉතිහාසයක් පුරාම අසීමිත බලයත්, විධායක බලයත් ඒකාධිපති බලයත් රටවලට හා ජනතාවට ලබාදී ඇත්තේ මර්දනය, යුද්ධ, ගැටුම් හා දුර්භික්ෂයන් හා මරණය මිස ජීවිතය නොවේ.

අපේ රටේ ජනතාවට දැන් අවශ්‍ය ජීවිතයයි. ජීවිතය විඳවන ජනයාට අවශ්‍ය විඳවන ජීවිතයක් නොව විඳින ජීවිතයකි. එය බලය ඉල්ලන ඉන්ද්‍රජාලකයින්ට කළ නොහැක. එය කළ හැක්කේ සමාජය වෙනස් කිරීම අරමුණු කරගත් බලයකටය; ජනතා ව්‍යාපාරයකටය.

රටක් හැදීම, ආර්ථිකයක් ගොඩනැගීම, සුන්දර සමාජයක් නිර්මාණය කිරීම තනි පුද්ගල වීර ක්‍රියාවක් නොව සාමූහික මිනිස් ප්‍රයත්නයකි. මිනිසුන් සාමූහිකව එක්වූ කල, අධිෂ්ඨානයෙන් පෙළගැසුණ කල, ආදර්ශමත් නායකත්වයන් වටා පෙළගැසුණු කල බොහෝ විස්කම් කළ හැකිය. රට හැදීමට ප්‍රතිපත්ති ඇති, දැක්මක් ඇති, ආදර්ශයන්ගෙන් විශ්වාසය දිනා ඇති නායකත්වයක් සහිත මහජන ව්‍යාපාරයකට කළ නොහැකි කිසිවක් නැත. මේ මහා ව්‍යසනය පරදා රටට ජනතාවට සැබෑ ජයග්‍රහණ ගෙන ආ හැක. ඒ සඳහා දැන් අවශ්‍ය ජනතාවගේ මැදිහත්වීම පමණි.

මෙය බොරු වීරයන්, පුහු කතාකරුවන්, පූච්චානම් දොඩවන්නන්, තක්කඩින්, සොරුන් එතෙක් පැළඳ සිටි බොරු වෙස්මුහුණු ගැලවී හෙළිදරව් වන කාලය වේ. වසර සියයකින් වටහා ගත නොහැකි දේශපාලන පාඩම් සතියෙන් දෙකෙන් උගන්වන කාලය වේ. එබැවින් දැන් වගකීම ඇත්තේ  ජනතාවගේ පැත්තේය. ජනතාව පාඩම් උගත යුතුවාක් මෙන්ම රටක් වැනසූ, ජනතාව රැවටූ පාලකයන්ට යස පාඩම් උගැන්විය යුතුද වේ. මේ ව්‍යසනයෙන් මිදීමේ එකම හා නොවරදින මඟ අතීතයෙන් හා වර්තමානයෙන් පාඩම් ඉගෙන සුන්දර අනාගතයක් වෙනුවෙන් වෙනස්වීමය. ඒ හැර මේ විපතින් මිදීමට ජනතාවට අන් මඟක් නැත.

# අර්බුදය හමුවේ අක්‍රීය වූ ආණ්ඩුවේ බලය




2019 වසරේ අග මෙරට ජනයා 69 ලක්ෂයක ජන වරමකින් ගෝඨාභය රාජපක්ෂ සිංහාසනාරූඪ කරනු ලැබුවේ ඔහු රට තුළ දුර දැක්මක් සහිත, දැනුමක් සහිත, ශක්තිමත්ම පාලකයා ලෙස එවැනි බලගතු පාලනයක් බිහිකරනු ඇතැයි යන අවංක විශ්වාසයෙනි. එසේම ගෝඨාභය රාජපක්ෂ චරිතයට චරිත සහතික ලියූවන්ද, ඔහු වටා විවිධ ප්‍රබන්ධ ගොඩනැගූවන්ද ජනතාවට සහතික කළේ, ඔහු රට වෙනස් කරනු ඇති බවය. ඒ සඳහා ඔහුට නිදහසේ වැඩ කිරීමට, විපක්ෂයේ 'බාධාවලින්' තොරව වැඩ කිරීමට, අවශ්‍ය බලයද ලබාදිය යුතු බව ඔවුහු පැවසූහ. රාජපක්ෂ කල්ලියද එසේම පැවසීය. ඒ අනුව ඊළඟ මහ මැතිවරණයේදී ජනතාව ඔවුනට තුනෙන් දෙකකට ආසන්න ජනවරමක් ලබාදුන් අතර ආණ්ඩුව එය තුනෙන් දෙකක් බවට පත්කර ගත්තේය. ඉන් නතර නොවී එකී ජනවරම යොදාගනිමින් 20වැනි සංශෝධනය සම්මත කර ජනාධිපතිවරයාට අසීමිත බලයක්ද ලබා ගන්නා ලදී. ඒ 'රට හැදීම' සඳහාය.

දැන් සිදුව ඇත්තේ කුමක් ද? රට මුහුණදී ඇති බරපතළ මූල්‍ය අර්බුදය හමුවේ අසීමිත බලය, තුනෙන් දෙකේ බලය 'යුද්දෙට නැති කඩුව' බවට පත්ව හමාරය. රටක් හදන්නේ නම් ඒ සඳහා අත්‍යවශ්‍ය සාධකය 'බලය' නොව 'මොළය'  බව දැන් පැහැදිලි වෙමින් තිබේ. ලංකාව තුළ දැන් මතුව ඇති විශාලතම මූල්‍ය අර්බුදය එක රැයකින් ඇති වූවක් නොවේ. එය වසර ගණනාවක් තිස්සේ අනුගමනය කළ, නිෂ්පාදන මාර්ග දුර්වල කරන ලද, ණය මත යැපෙන ලද හා නාස්තිය, සොරකම ජානගත කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයකි. ලංකාව මුහුණ දෙමින් සිටි මෙම මූල්‍ය අර්බුදය ඉදිරියේදී පුපුරා ගොස් රට අක්‍රීය වනු ඇති බව මාස කිහිපයකට කලින් දැකීමට වත්මන් පාලනය අසමත් විය. බලයට වඩා මොළය වැදගත් යැයි අප කීවේ එම අර්ථයෙනි. මෙහි බරපතළම ඛේදවාචකය නම් අද පවා මෙහි ව්‍යසනකාරී බව තේරුම් ගැනීමට පාලක කණ්ඩායම් අසමත් වීමත්, ඔවුන් සිහින ලොවක ජීවත් වෙමින් ජනතාවටද සිහින පෙන්වීමට උත්සාහ කිරීමය.

දැන් රටේ යථාර්ථය කුමක්ද? ලංකාවට අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වා ගැනීමට විදේශ වත්කම් නැත. තෙල් ගෙන්වා ගැනීමට මුදල් නැතිකම නිසා තෙල් හිඟයක් මතුවී තිබේ. ඒ අතරේ තෙල් මිල ඉහළ යාමේ අවදානමද තිබේ. තෙල් හිඟය හා විදුලි බල මණ්ඩලයට අවශ්‍ය තෙල් අඛණ්ඩව සැපයීමට අපොහොසත් වීම නිසාත්, ජල විදුලිය නිෂ්පාදනය අඩුවීම හා නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය අක්‍රීය වීම නිසාත් ජනතාවට අඛණ්ඩව විදුලිය සැපයීමක් ලබාදීමට ආණ්ඩුව අසමත්ව ඇත. තෙල් හා විදුලිය සැපයීම අඩාලවීම නිසා සාමාන්‍ය ජන ජීවිතය අවුල් වී ජනතාව පීඩාවට ලක්වීමට අමතරව රටේ නිෂ්පාදනය යළි බිඳ වැටීමටද එය බලපා තිබේ. කෘෂිකර්මයට, කර්මාන්තවලට ධීවර කර්මාන්තයට මෙම අර්බුදය සෘජුවම බලපා තිබේ. එහෙත් මෙම කේන්ද්‍රීය අර්බුදය හමුවේ ආණ්ඩුව සිටින්නේ අඳුරේ අතපත ගාමින්ය.

රාජපක්ෂවරු ජනාධිපතිට අසීමිත බලයක් හා තුනෙන් දෙකේ පාර්ලිමේන්තුවක් ඉල්ලන අවස්ථාවේ ප්‍රකාශ කළේ ඉදිරියේ එන අර්බුදයන්ට මුහුණ දී රට හැදීමට එවැනි බලයක් නැතිව බැරි බවකි. එහෙත් දැන් සිදුවී තිබෙන්නේ කුමක්ද? ජනාධිපතිගේ විධායක බලයට හා තුනෙන් දෙකේ බලයට බඩු මිල පාලනය කිරිමට නොහැකි වී තිබේ. එය මොනතරම් ද කිවහොත් එතෙක් පැවති මිල පාලනයද අතහැර තිබේ. රටට අවශ්‍ය තෙල් ටික ගෙනැත් දීමට අඛණ්ඩව විදුලිය සැපයීමට, ඩොලර් ටිකත් හොයා ගැනීම, වැනි කරුණු ඉදිරියේ දැන් විධායක බලය අසරණ වී තිබේ.

දැන් රටේ පාලනය ආණ්ඩුවෙන් ගිලිහී ගොස්ය. රටේ දැවැන්ත අර්බුදයක් තිබියදී ඊට මැදිහත් වෙනවා වෙනුවට ජනාධිපතිවරයා 'ආතල්' ගනිමින් සිටී. ඔහු විටෙක රත්මලානේ දුම්රිය වැඩපළ නැරඹීමට යයි. තවත් විටෙක මිල්කෝ ආයතනය බැලීමට යයි. දැන් ජනාධිපති කටයුතු කරන්නේ අධ්‍යාපන චාරිකා යන පාසල් ළමයෙක් සේය.

> දැන් සිදුව ඇත්තේ කුමක් ද? රට මුහුණදී ඇති බරපතළ මූල්‍ය අර්බුදය හමුවේ අසීමිත බලය, තුනෙන් දෙකේ බලය 'යුද්දෙට නැති කඩුව' බවට පත්ව හමාරය. රටක් හදන්නේ නම් ඒ සඳහා අත්‍යවශ්‍ය සාධකය 'බලය' නොව 'මොළය'  බව දැන් පැහැදිලි වෙමින් තිබේ.

වෙනදා ඕනම දේකට යෙදවීමට කෝකටත් තෛලය ලෙස ඔහු යොදාගත් හමුදා ලොක්කෝද මෙම අර්බුදය හමුවේ 'සේවයට' කැඳවා නැත. ඉන් පෙන්වන්නේ වර්තමාන අර්බුදය හමුවේ වර්තමාන පාලකයින්ගේ සියලු බල අධිකාරයන් වැඩකට නැතිවී ඇති බවය. එවා දැන් ඉන්ධන නැති වාහන සේ අක්‍රීය වී තිබෙන බවය.

'කුණාටු සහිත මුහුද හොඳ කප්පිත්තන් බිහිකරන්නේය' යනුවෙන් කියමනක් තිබේ. එසේම කුණාටු සහිත මුහුද බොරු කප්පිත්තන් හෙළිදරව් කරන්නේය, යන්නද ඊටම අදාළ වේ. මෙය බොරුකාරයන් විසින් පුම්බන ලද ව්‍යාජ ප්‍රතිරූප බිඳවැටෙන, බොල් පිළිම ඇද වැටෙන තරමේ අර්බුදයකි. මෙම අර්බුදය දැන් ඉල්ලා සිටින්නේ සැබෑ ජනතා වැඩ පිළිවෙළක්, විසඳුමක් හා ඊට නායකත්වය දිය හැකි මහජන ව්‍යාපාරයකි. ජනතාව අතරින් ආ නායකත්වයකි.

දවසේ බඩු ටික ගැනීමට ණයක් හොයා ගනිමින්, කෙසේ හෝ දවස ගෙවා ගනිමින්, මෙම අර්බුදය තුළ වැඩිදුරක් ගමන් කිරීම ආණ්ඩුවට මෙන්ම ජනතාවටද නොහැකි වන බව පැහැදිලිය. අතීතයේ ඉදිකිරීම් ව්‍යාපෘතිවලට ගත් ණය පොලී ගෙවා ගත නොහැකිව සිටියේදී දැන් ණයට බඩු ගැනීමට සිදුව ඇති ආණ්ඩුවට ඊළඟට මුහුණ දීමට සිදුවන්නේ බඩු ගැනීමට ගත් ණයද ගෙවා ගැනීමට නොහැකිව ණයට බඩු ගැනීමද අවසන් වන අර්බුදයකටය. ඒ නිසා ඉදිරි මාස කිහිපය දැනට වඩා අර්බුදකාරී වන බව පැහැදිලිය. ධනවාදය, නව ලිබරල් ආර්ථිකය, ධනවාදී පාලනය එකවරම නතර වන දිනය වැඩි ඈතක නොවන බව පැහැදිලිය.

එහෙත් එවැනි තත්වයකට මුහුණ දීමට දැනුම, හැකියාව ධෛර්යය හෝ ඕනෑකම වර්තමාන පාලකයින්ට නැත. දැන් ඇමතිවරු යනු අර්බුදයට විසඳුම් හොයන අය නොව අර්බුදයේ තත්වය ජනතාවට ප්‍රකාශ කරන මාධ්‍ය ප්‍රකාශකලාගේ තත්වයට වැටී තිබේ. ඒ ඔවුන්ගේ සැබෑ හැකියාවය. ඊට ඔවුනට දොස් පවරා වැඩක් නැත. දොස් පවරා ගත යුත්තේ එවැනි බොල් මිනිසුන්ට බලය ලබා දීමට දායක වූ තමන්ටමය.

කෙසේ වෙතත් එකක් පැහැදිලිය. ලංකාවේ ධනපති ක්‍රමයේ ගමන දැන් අවසන්ව ඇත. ලංකාවේ වර්තමාන සමාජ ආර්ථික ක්‍රමය හරියටම හදවත රෝගී වීමෙන් රුධිර සංසරණ පද්ධතිය නතර වී ඇති, දැඩි සත්කාර ඒකකයේ තබාගෙන කෘත්‍රිමව ස්වසනය හා රුධිරය ටික ටික සපයන, කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන රෝගියෙකුගේ තත්වයට පත්ව තිබේ. එබැවින් දැන් යළි ධනවාදී ක්‍රමයට පණ දිය නොහැක. දැන් අවශ්‍ය වන්නේ මිනිසුන්ගේ ජීවිතවලට විශාල පීඩාවක් දුන්, සමාජය දූෂ්‍ය කළ, මිනිස් සිත් දූෂ්‍ය කළ, සමාජය තුළ සමාජ විරෝධී, මානව විරෝධී විෂබීජ පතුරුවා හරින ධනවාදී මළකුණ මිහිදන් කර, ඒ මත නව සමාජයක්, නව ලෝකයක් ඉදිකිරීමට ජනතාව පෙළ ගැසීමය. පැරණි ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් සඳහා පැරණි පාලනය වෙනුවට නව පාලනයක් සඳහා ජනතාව පැරණි දේශපාලනය

11 වැනි පිටුවට



YES WE CAN

# ගමනාන්තය අභියස

තෙල්, තෙල්, තෙල්.. තෙල් පෝලිම්, තෙල් උද්ඝෝෂණ, තෙල් ගැටුම්, තෙල් වාද විවාද... ලෝක වෙළෙඳපොළේ හෝ මැදපෙරදිග නොවේ!, මේ අප ජීවත්වෙන ලංකාවේ තෙල් අර්බුදය නිසා ඇති වී ඇති තත්වයයි..

අද වන විට තෙල් නොමැතිකම නිසා ඉන්ධන පිරවුම්හල් ඉදිරිපිට දිගු පෝලිම්ය. ඒ පෝලිම්වල ඇහෙන්නේ මිනිසුන්ගේ දුක් අඳෝනාවයි. මිනිස්සුන්ගේ දුක මුසු වූ වේදනාවයි. වේදනාව සමඟ මුසු වූ වෛරී ප්‍රකාශයි. ආවේගයයි. යම් වරදක් තමාගේද ඇති බව හැඟෙන පාපෝච්චාරණයි.

මිනිස්සුන්ගේ එදිනෙදා වැඩ සියල්ල අකර්මණ්‍ය වී ගොසිනි. ගොවියාගේ ගොවිතැනේ අස්වැන්න නෙළන යන්ත්‍ර පණගැන්වීමටවත් තෙල් නොමැතිව, කුඹුරුයාය දෙස බලා හූල්ලමින් සිටීමට ගොවියාට සිදු වී ඇත. යන්තමින් හෝ සොයාගත් ආහාර ටික තම්බාගැනීමට නිවසේ භූමිතෙල් හෝ විදුලිය හෝ නොමැත. වැඩපොළකට යෑමට පාරට බැසගත් විට මගී බස් රථය මඟ නතර වන්නේය. තෙල් නොමැතිව පුද්ගලික වාහනද එහෙට මෙහෙට යාමට නොහැකිව මහමඟය. වැඩපොළට ගියද දවසේ බාගයක් වැඩ නොමැත. ඒ, විදුලි කප්පාදුවට හසුවී ඇති බැවිනි. දූ දරුවන්ගේ විභාග කටයුතු සිදුවන්නේද ලාම්පු එළියෙනි. ඒ ද භූමිතෙල් තිබුණොත් පමණි.

මෙසේ සාමාන්‍ය ජන ජීවිතය මුළුමනින්ම අකර්මණ්‍ය වී ඇත. ගමනාගමනය යථා තත්වයේ නොමැත. වෙළෙඳපොළ ගනුදෙනු දුර්වලය. වරාය සහ කර්මාන්තද තෙල් අර්බුදය නිසා ජනිත වූ විදුලි අර්බුදය මගින් අකර්මණ්‍ය කොට ඇත. හෙට රටම එක තැන නතර කරන අර්බුදයක් බවට තෙල් අර්බුදය පත්ව අවසන්ය.

රටේ ඉන්ධන අවශ්‍යතාව සැපිරීම වෙනුවෙන් මහඟු දායකත්වයක් ලබාගත හැකි සපුගස්කන්ද පිරිපහදුව කල්තියාම වසා දැමීමට ගත් තකතීරු තීරණය මෙම ඉන්ධන අර්බුදය තවත් තීව්‍ර කළේය. මේ නිසා ඛනිජ තෙල් ගෙන්වීම වෙනුවට පිරිපහදු කළ තෙල් ගෙන ඒම වෙනුවෙන් අමතරව විශාල වියදමක් දැරීමට සිදු වී ඇත. අපට ලෝක වෙළෙඳපොළෙන් භූමිතෙල් මිලදී ගැනීමට සිදු වී තිබෙන්නේ ගුවන්යානා ඉන්ධන ලබාගන්නා මිල ගණන්වලටය. එසේම මෙවැනි අර්බුදයකදී ඉතාම වැදගත්වන ත්‍රිකුණාමල තෙල්ටැංකි සංකීර්ණයෙන් අප ප්‍රයෝජනයක් ගත්තේද නැත. එම ටැංකි සංකීර්ණය අපට අහිමි කරගෙන අවසන්ය.

තත්වය එසේ තිබියදී, දිනෙන් දින උත්සන්න වන ජනතා විරෝධය වත්මන් පාලකයින්ට පාලනය කරගැනීමට නොහැකි බව දිනෙන් දින පසක් වන්නේය. අයි.ඕ.සී. සමාගම තෙල් මිල නැවත වරක් ඉහළ දැමුවේ ලංකාවේ ඉන්ධන සැපයුමේ ආධිපත්‍යය නැවතත් සියතට ගනිමිනි. එසේම යුක්‍රේන හා රුසියානු යුද ගැටුම් ලෝක වෙළෙඳපොළේ තෙල් මිල තවත් ඉහළට ඇද දමා ඇත. එය අපේ තෙල් මිලදී ගැනීමේ හැකියාව තවත් පහළට ඇද දමා ඇත. මෙවැනි වටපිටාවක් තුළ තෙල් සැපයීම හෝ පැරණි මිලට තෙල් සැපයීම ආණ්ඩුවට සිදු කළ නොහැක. එසේ කිරීමට තරම් ආර්ථික ශක්තියක් රඳවා ගැනීමට වත්මන් ධනවාදී පාලනයට නොහැකි වී ඇත..

මේ සියල්ලෙන් පෙනෙන්නේ ධනේශ්වර පාලනයේ නොහැකියාවයි. අර්බුදයේ බැරෑරුම්කමයි. ක්‍රමයෙන් වර්ධනය වෙමින් ආ අර්බුදය දැන් එහි ගුණාත්මක පියවරකට එළඹ තිබේ. එම ගුණාත්මක පියවර, අසමත් ලාංකේය ධනේශ්වර ආර්ථිකයේ ගමනාන්තය බවට පත් කළ යුතුමය. ඒ වෙනුවෙන් සංවිධානය වෙමු! ශක්තිමත් වෙමු!! සටන් කරමු!!!

# ආණ්ඩුවේ හෙංචයියන්ට රක්ෂිතයේ ගල්කොරි දැමීමට අවසර

## වන අලි හා පුරාවිද්‍යා ප්‍රදේශ අනතුරක

හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වලල්ල ග්‍රාමසේවා වසම තුළ මේ වන විට දේශපාලන බලය භාවිතා කරමින් ගල්කොරි ආරම්භ කර ඇත. මෙම ගල්කොරි පවත්වාගෙන යෑමට අවසර ලබාදී ඇත්තේ යෝජිත අලි කළමනාකරණ රක්ෂිතය තුළය. එසේම මෙම භූමිය පුරාවිද්‍යා වටිනාකමකින් යුතු භූමියක්ද වේ.

මේ පිළිබඳ සොයා බැලීම සඳහා සමාජවාදී තරුණ සංගමයේ සාමාජිකයෝ පිරිසක් පසුගිය පෙබරවාරි 19 දින නිරීක්ෂණ චාරිකාවක යෙදුනහ. එහිදී මෙම රක්ෂිතය විනාශ කරමින් පාරවල් ඉදිකරමින් ගල්කොරි ආරම්භ කර ඇති ස්ථාන කිහිපයක් දැකගැනීමට හැකි විය. පසුගිය කාලයේ දී වල්සපුගල ගොවීන් විසින් වන අලි කළමාකරණ කලාපයක් වෙන් කිරීමට කළ අරගලයේ ජයග්‍රහණයක් ලෙස මෙම ප්‍රදේශය අලි කළමනාකරණ කලාපයක් ලෙස ගැසට් කරන ලදී. නමුත් මෙවැනි අධිසංවේදී පරිසර කලාපය තුළ ගල්කොරි පවත්වාගෙන යෑම නිසා, වන අලි එම ප්‍රදේශවලින් ඉවත්වීමේ අවදානමත් එම වන අලින් වගා බිම්වලට පැමිණීමේ අවදානමත් මතුව තිබේ. එසේම මෙම ගල් කඳු පංතියේ එක් කොටසක් ලෙස පවතින පුරාවිද්‍යා භූමියද විනාශ වීමේ අවදානමට ලක්ව ඇත. ආණ්ඩුවේ බල වුවමනාව වෙනුවෙන් ප්‍රදේශයේ දේශපාලන හෙංචයියන්ට මෙම පරිසර පද්ධතිය විනාශ කිරීමට අවසර ලබාදී තිබෙන්නේ එසේ තිබියෙදීය.

ආණ්ඩුවේ මෙම ක්‍රියාකලාපයට එරෙහිව විරෝධය පළ කරන සමාජවාදී තරුණ සංගමය මේ පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු බව තරයේ අවධාරණය කරයි. එසේ නොමැති වුවහොත් ඊට එරෙහිව රටේ තරුණ තරුණියන්, පරිසර හිතකාමීන් ඇතුළු ප්‍රගතිශීලී ජනතාව සමග ක්‍රියාමාර්ග ගැනීමට සූදානම් යැයි මේ පිළිබඳව අදහස් දක්වමින් සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ප්‍රකාශ කළේය.








තරුණ

# වීරත්වය අවැසිම මොහොතක...

විමුක්තියේ බණ
දෙසා ලෝකය අභිමුව
විකුණමින් ස්ත්‍රීත්වය
හැම තැනම...
දෝංකාරය අසමින්
කාන්තා විමුක්තියේ
පල්ව එක ගොහොරුවක
නිදහස නන්දොඩවන
මුසාවක දැවටුන
විමුක්තිය...
උදාකර ගැනුමට
ඉතිහාසයේ පාඩම
උගෙන,
අධිපති රැහැන් බැම්
බිඳිනු වෙනුවට
රකිනුද කෙලෙස
උන්ගේ ඊනියා සාමයේ
රිදුම් පිරිමදිමින්...
ඇත තවත් සටනක්
ලියා නැති සටහනක්
ස්ත්‍රී විමුක්තියේ
නැණ පහන් දල්වනු වස්
නුඹටත්, අපටත් ඇති
සාධාරණත්වයේ සටනක්...
පුරුෂාධිපත්‍යයටම නොව,
හිමිතැනට හිමි
සාධාරණත්වයේ සටනක්...
නුඹමයි එහි අවිය,
නුඹමයි එයට එළිය...





### දත්ත රැස් කිරීමේ චෝදනාවට FaceBook ඩො.මි. 90ක් ගෙවයි



FaceBook වෙබ් අඩවිය මගින්එහිපරිශීලකයින්ගේපෞද්ගලිකතොරතුරු රැස් කිරීම සම්බන්ධයෙන් එල්ල වී ඇති චෝදනාව වෙනුවෙන් ඩොලර් මිලියන 90ක් ගෙවීමට Meta Inc සමාගම එකඟ වී ඇති බව විදෙස් මාධ්‍ය සඳහන් කරයි.

FaceBook පරිශීලකයන් ගිණුමෙන් ඉවත් වීමෙන් පසුවත් ඔවුන්ගේ දත්ත රැස් කර ඇති බවට චෝදනා එල්ල වී තිබිණි. මේ සම්බන්ධව කැලිෆෝනියාවේ සැන්ජොසේ දිස්ත්‍රික් අධිකරණයේ නඩු විභාගයක් පැවැත්විණි.

තවද FaceBook සමාගම සිය පරිශීලකයන් පිවිසෙන වෙබ් අඩවි සම්බන්ධයෙන් තොරතුරු රැස්කර ගැනීම සඳහා පරිඝනක හෝ ස්මාර්ට් දුරකතන තුළ කුකීස් වැඩසටහන් ගබඩා කරන බවද අනාවරණය වී ඇත. රැස්කරගත් දත්ත දැන්වීම්කරුවන් වෙත අලෙවි කළ බවටද චෝදනා එල්ල වී ඇත. පසුව මෙම දත්ත සියල්ල මකාදැමිය යුතු බවට අධිකරණයෙන් FaceBook වෙත දැනුම් දී ඇත.

### Metaverse තාක්ෂණයෙන් පැවැත්වුණු ඉන්දියාවේ විවාහ උත්සවය



ඉන්දියාව තුළ ප්‍රථම වරට ත්‍රිමාණ Metaverse තාක්ෂණය භාවිතා කරමින් සංවිධානය කෙරුණ විවාහ උත්සවයක් පසුගියදා පැවැත්විණි.

ඉන්දියාවේ ඩිජිටල් මාධ්‍ය ආයතනයක් වන Wavemarker India සමාගමට සහ එරට සුප්‍රසිද්ධ මංගල යෝජනා වෙබ් අඩවියක් වන Martimony.com සංවිධානයේ මූලිකත්වයෙන් මෙය සිදුව ඇත. ඒ අනුව Metaverse තාක්ෂණය ඔස්සේ මනාල යුවල ඩිජිටල් අවතාර දෙකකින් සම්බන්ධ වී ඇති අතර ආරාධිත පිරිස්ද ඩිජිටල් අවතාර ලෙස පෙනී සිට ඇත. මෙහි සැබෑ විවාහ මංගල උත්සවය බෝපාල් නුවරදී පැවතී ඇත. කෝවිඩ් වසංගත තත්වය හමුවේ ආරක්ෂිතව මෙම අවස්ථාවට සහභාගී වීම මෙහි අරමුණ වී ඇත. මේ සඳහා 500 දෙනෙකු සම්බන්ධ වී ඇති බව වාර්තා වේ.

### ප්‍රාථමික සෛල බද්ධයකින් HIV සුව වූ ප්‍රථම කාන්තාව ඇමරිකාවෙන්





ඇමරිකා එක්සත් ජනපදයේ වෙසෙන කාන්තාවකට ප්‍රාථමික සෛල බද්ධයකින් අනතුරුව ඍෂඩ් රෝගය සුව වී ඇති බවට වාර්තා වේ.

ඇයට ලියුකේමියා රෝගී තත්වයද තිබී ඇති බැවින් ස්වාභාවිකවම HIV වෛරසයට ප්‍රතිවිරෝධතාවක් දක්වන දායකයෙකුගෙන් මෙම ප්‍රාථමික සෛල ප්‍රදානය සිදුකර ඇත. ඇයගේ ඇටමිදුළුවල පැවති ලියුකේමියා රෝගයට ප්‍රතිකාර ලෙස සෛල බද්ධය සිදුකර ඇති අතර එයින් HIV සුවඅතට හැරුණු බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි.


### මිනිසුන් නොමැති චීනයේ ගොවිබිම



චීනයේ නැගෙනහිර ප්‍රදේශයේ අනුහුයි පළාතේ බොසොයු නගරයේ ගොවිබිමක් කිසිදු මිනිස් ශ්‍රමයකින් තොරව සම්පූර්ණයෙන් යාන්ත්‍රිකව සිදුකරන ආකාරය පසුගියදා විදෙස් මාධ්‍ය අනාවරණය කළේය.

මෙහිදී ගොවිබිමේ ඇති පැල සඳහා මුල් කාලයේදී ජලය හා පොහොර සඳහා නලමාර්ග යොදා ඇත. අනතුරුව හෝග වැඩෙද්දී ඊට අවශ්‍ය පලිබෝධනාශක ඇතුළු යෙදවුම් ඩ්‍රෝන යානා මගින් ලබා දෙනු ලබයි. ගොවිබිමෙන් මෙපිට සිටින පිරිස් දුරස්ථ පාලක යොදාග නිමින් ඩ්‍රෝන යානා පාලනය කරන අතර, ජලය හා පොහොර විදීමත් පරිඝනක පද්ධතියක් ඇසුරෙන් සිදු කරන බව වාර්තා වේ.

# ඉතිහාසයේ රෝදය කැරකෙන්නේ ඉදිරියටයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

***නියමුවා:-** ලංකාව මේ වන විට විශාල අර්බුදයක තියෙන්නෙ. මේ අර්බුදය ඔබ හඳුනාගන්නෙ කොහොමද?*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ලංකාවේ දැන් තිබෙන අර්බුදය ඉතාම විශාලයි. එය ආර්ථික සමාජ, දේශපාලන හා සංස්කෘතික සියලු ක්ෂේත්‍ර වෙලාගත්තු එකක්. කොහොම වුණත් මෙහි ප්‍රධාන හා විශාලතම අර්බුදය වෙන්නේ, ලංකාව මුහුණ දී තිබෙන මූල්‍ය අර්බුදයයි. මේක එක දවසක ඇති වුණු දෙයක් නොවෙයි. දශක හතකට වැඩි ලංකාවේ පසුගාමී ධනේශ්වර දේශපාලන මඟ තුළත් විශේෂයෙන් දශක හතරකට වැඩි ඊනියා විවෘත ආර්ථිකය තුළත් පවත්වාගෙන ආ බංකොලොත් ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති නිසා ප්‍රමාණාත්මකව වර්ධනය වූ අර්බුදයේ ගුණාත්මක තත්වයක් තමයි දැන් අපි දකින්නේ.

මේ වන විට ලංකාව විශාල විදේශ විනිමය අර්බුදයකට මුහුණ දී තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට පවා හැකියාව නැතිවෙලා තිබෙනවා. මේ වන විට රටට අත්‍යවශ්‍ය භාණ්ඩ රැගෙන ආ බහාලුම් දෙදහකට වැඩි ප්‍රමාණයක් ඩොලර් නැතිකම නිසා නිදහස් කර ගැනීමට බැරිව තිබෙනවා. අද විශාල භාණ්ඩ හිඟයක් තිබෙනවා. ආහාරවල මිල දිනපතා ඉහළ යනවා. ලොව ආහාර උද්ධමනය වැඩිම රටවල් අතර ලංකාව 12වැනියා වෙලා. ණය ගෙවා ගැනීමට නොහැකි තත්ත්වයට වැටිලා. දැන් ආණ්ඩුව බඩු ගන්නේ ණයට. හැම රටෙන්ම ඩොලර් හිඟා කනවා, බඩුටික ගන්න. මෑතදීම පකිස්ථානයෙන් ඩොලර් මිලියන 200ක් හා ඕස්ට්‍රේලියාවෙන් ඩොලර් මිලියන 200ක් ගන්න හදනවා. දැන් තෙල් ගන්නෙ ඉන්දියාවෙන්, ණයට ගත්තු ඩොලර් මිලියන 500ට. තෙල් සැපයීම සීමා වෙලා. ඒ වගේම මිල ඉහළ යාමකුත් තිබෙනවා. විදුලි අර්බුදයක් ඇති වෙලා. ඇත්ත වශයෙන්ම රටේ නිෂ්පාදන මාර්ග විනාශ කරමින් පවත්වාගෙන ආ ණයට කන ආර්ථිකයත් මහජන මුදල් නාස්ති කළ වංචා, දූෂණ හා හොරකමත් නිසා රට බංකොලොත් වෙලා තියෙන්නේ.

***නියමුවා:-** නමුත් ජනාධිපතිවරයා කියනවා නේද, ඉදිරි අවුරුදු තුනේ රට ගොඩනගන්න පුළුවන් කියලා.*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මොන බොරුද? ඒ ගොල්ලන්ට මේ රට ගොඩනගන්න බැහැ. ඉදිරි අවුරුදු කිහිපයත් රට මේ වගේම විනාශයක් කරා ගෙන යෑම තමයි සිදුවන්නෙ. රටේ අර්බුදයට හේතුව නිෂ්පාදන මාර්ග දුර්වල කිරීම, වංචා - දූෂණ හා ණය මත යැපීමයි. ඉතින් දැන් ඒවා වෙනස් කරනවාද? නැහැ. තාම ණය ගන්නවා. කලින් ණය ගත්තෙ විවිධ ව්‍යාපෘතිවලට. දැන් ණය ගන්නෙ බඩු ගන්න. ඉතිං ණය ප්‍රමාණය තව වැඩිවෙනවා. වංචාව, දූෂණය, නාස්තිය තවමත් එහෙමමයි. ඒ අතර වැරදි හිතුවක්කාර උද්ධච්ච තීරණ ගන්නවා. මේ පොහොර ප්‍රශ්නය නිසා කෘෂිකර්මාන්තය බිඳවැටිලා. වාණිජ භෝග බිඳවැටිලා. දැන් හාල් ටිකත් රටින් ගේන්න වෙලා. ඒ නිසා මෙතෙක් ආපු මේ ණයට කන, විකුණන, හොරාකන ක්‍රමය පවත්වාගෙන යමින් රට හදන්න බැහැ. ඉදිරි කාලයේ රටේ අර්බුද මීට වඩා වැඩිවෙනවා. ජනතාව විශාල ලෙස පීඩාවට පත්වෙනවා. ඉදිරියේදී තෙල් හිඟයක් හා මිල වැඩි කිරීමක් වගේම විදුලිය කප්පාදුව තව වැඩි වෙනවා. ඒ අතර ආහාර හිඟයකුත් එනවා. ඒකයි ඇත්ත.

***නියමුවා:-** ඔබ දකින විදිහට මේ අර්බුදයට විසඳුම මොකක්ද?*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඉතාම කෙටියෙන් කිවුවොත්, අපේ රටේ මෙතෙක් පවත්වාගෙන ආ සමාජ ආර්ථික ක්‍රමය මුළුමනින්ම වෙනස් කරන සමාජ පරිවර්තනයක් අවශ්‍ය වෙනවා. ආර්ථිකයෙහි දේශපාලනයෙහි ගැඹුරු හා පුළුල් වෙනසක් කළ යුතු වෙනවා. මේ අධිරාජ්‍ය ගැති නව ලිබරල් ධනපති ක්‍රමය වෙනස් කර, නිෂ්පාදනය මත පදනම් වුණු ජන සහභාගී ආර්ථිකයත් හදන්න වෙනවා. ආර්ථිකයේ ප්‍රජාතන්ත්‍රවාදය වගේම ආර්ථිකයේ සාධාරණත්වයත් ඇති කළ යුතු වෙනවා. ඒ කියන්නේ ආර්ථිකයේ ප්‍රතිලාභ පවුල් කිහිපයකට නොව ඊට දායක වන සියලු ජනයාට සාධාරණව බෙදී යන ක්‍රමයක් හදන්න ඕනෙ. වංචාව, දූෂණය, හොරකම මුළුමනින්ම අතුගා දාලා දේශපාලනය ජාවාරමක් වෙනුවට සැබෑ මහජන සේවයක් බවට පත්කර ගන්න වෙනවා. ඒ කියන්නෙ සමාජවාදී මූලධර්ම මත නිර්මාණය වන සමාජ ආර්ථික ක්‍රමයක්. ඒ සඳහා ජනතාවාදී බලයක් පාලනයක් ගොඩනගන්න අවශ්‍යයි. එහෙම නැතිව මේ අර්බුදයෙන් ගොඩ එන වෙනත් මඟක් නැහැ. පරණ විදිහට මුහුණු මාරු කරල පාට මාරු කරලා පක්ෂ මාරුකරලා මේ අර්බුදයෙන් මිදෙන්න බැහැ.

***නියමුවා:-** හොඳයි ඔබ යෝජනා කරන පාලනය, ඔබ යෝජනා කරන ආර්ථිකය කුමන වර්ගයේ එකක්ද විවෘත ආර්ථිකය වෙනුවට සංවර්ධන ආර්ථිකයකට යනවද? පැහැදිලි කළොත්...*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මෙහෙමයි. මෙතෙන වැරැද්ද තියෙන්නේ ආර්ථිකයේ විවෘතභාවය තුළ නොවෙයි. ආර්ථිකයේ පදනම හා අරමුණ තුළයි. ලෝකයේ අපි කාටත් හැකිලුණු සංවෘත ආර්ථිකයකට යන්න බැහැ. ඒක පැරණි ධනවාදීම ආකෘතියක්. ඒක අසාර්ථකයි. අපි පෙනී සිටින්නේ ආර්ථිකයේ විවෘතකම එනම්, ආර්ථිකයේ ප්‍රජාතන්ත්‍රවාදය වගේම ආර්ථිකයේ සාධාරණත්වයද රැකෙන ක්‍රමයක් වෙනුවෙන්.

ඇත්ත වශයෙන්ම අපි ගොඩනඟන්න ඕනෙ නිෂ්පාදනය මත පදනම් වුණු ආර්ථිකයක්. ඒක සමාජවාදී මූලධර්ම මත ගොඩනැගෙන සමාජ සාධාරණත්වය නියෝජනය කරන ආර්ථිකයක් හා ජනතාවාදී පාලනයක්. දැන් මේ අසමත් වෙලා අර්බුදයට ගිහින් තියෙන්නේ ධනවාදී නව ලිබරල් ආර්ථික ක්‍රමය. ඉතින් ඒක වෙනස් නොකර රට මේ විනාශයෙන් ගොඩගන්න බැහැ. ඒක කරන්න වෙන්නේ ලංකාවේ විශේෂතාවයත් වගේම නූතන ලෝක තත්වයත් සැලකිල්ලට ගනිමින් සමාජවාදී මූලධර්ම මත කරන පුළුල් සමාජ ආර්ථික දේශපාලන පරිවර්තනයකින් පමණයි.

***නියමුවා:-** හොඳයි. දැන් ඔබේ පක්ෂයත් මූලික වී මේ දිනවල ජාතික ජන බලවේගය ගොඩනගමින් යනවා. ජනතා විමුක්ති පෙරමුණ තිබියෙදී ඇයි තවත් ජාතික ජන බලවේගය නමින් පක්ෂයක් අවශ්‍ය වෙන්නේ.*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ අපේ රටේ තිබෙන ප්‍රධාන හා විශාලම වමේ පක්ෂය; විප්ලවවාදී පක්ෂය. අපේ පක්ෂය, අපේ පංතියේ පෙරමුණු බල ඇණිය ලෙසයි, අපි සලකන්නේ. ඒත් සමාජ පරිවර්තනයකදී විප්ලවවාදී පක්ෂයක නායකත්වය වගේම පොදු ජනතාවගේ සහභාගිත්වයත් ඉතාම වැදගත්. ඒ අර්ථයෙන් ගත්තම මේ වෙලාවේ ජාතික ජන බලවේගය ගොඩනැගීම ඓතිහාසිකව ඉතාම වැදගත් කාර්යයක්. දැන් අපි ජීවත් වෙන්නේ සමාජ පරිවර්තනීය යුගයක. ධනවාදයේ අර්බුදය මෝරා ගොස් විප්ලවීය තත්වයක් කරා වර්ධනය වීමේ ඉඩ තිබෙනවා. ඒ වගේම සමාජ පරිවර්තනයක අවශ්‍යතාවය මතුවෙලා තියෙනවා. එහිදී පොදු ජනතාව සංවිධානය කර ගැනීම ඉතාම වැදගත්.

ජාතික ජන බලවේගය කියන්නේ එහි පදනම් ලේඛනවලම සඳහන් කර ඇති ආකාරයට වමේ, ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී බලවේගවල පුළුල් සංවිධානයක්. ඒ තුළ ජනතා විමුක්ති පෙරමුණට අමතරව තවත් වමේ සංවිධාන, ප්‍රගතිශීලී සංවිධාන, පුද්ගලයන්, රැසක් ඒකරාශීවී සිටිනවා. ඒ වගේම වෘත්තීය සමිති, ගොවි සංවිධාන, ධීවර සංවිධාන ආදී පංති බලවේගත් එක්ව සිටිනවා. ඉතින් සමාජ පරිවර්තනයක් සඳහා පොදු ජනතාව සම්බන්ධ කර ගැනීමේ අර්ථයෙන් ජාතික ජන බලවේගය මේ මොහොතේ ඉටු කරන්නෙ ඉතාම වැදගත් කාර්යයක්.

***නියමුවා:-** ජාතික ජන බලවේගය කියන්නේ ජනතා විමුක්ති පෙරමුණට බලය ගැනීම සඳහා හදාගත් එකක් ලෙස සමහරු කියනවා. ඒක ඇත්තද? ඒ වගේම අපේ රටේ අනෙක් පක්ෂ ඊට එකතු කර ගැනීමක් වෙනවාද? මේ පිළිබඳව ඔබේ අදහස?*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** අපි දන්නවා ජනතා විමුක්ති පෙරමුණ වටා ජාතික ජන බලවේගය වටා ජනතාව විශාල වශයෙන් ඒකරාශී වීම නිසා කලබල වුණ අපේ විරුද්ධවාදීන් විවිධ අසත්‍ය පුවත් හා විග්‍රහ නිර්මාණය කරනවා. වෙන පක්ෂවලට වගේ ජනතා විමුක්ති පෙරමුණට 'රජ වීමේ' ආසාවක් නැහැ. අපට අවශ්‍ය මේ විනාශයට පත් රට යළි හදන්නයි. මේ පීඩාවට පත් ජනයා ඒ පීඩාවෙන් මුදාගෙන ඔවුන්ට ලස්සන ජීවිතයක් නිර්මාණය කර දීමටයි. ඒ සඳහා රටේ පාලන බලය ජනතාව අතට ගත යුතු වෙනවා. ඒ සඳහා තමයි අපි ජාතික ජන බලවේගය නමැති පුළුල් බහුජන ව්‍යාපාරය ගොඩනඟන්නෙ.

ජාතික ජන බලවේගය කියන්නේ කොහොම හරි ආණ්ඩුවක් හදා ගැනීම සඳහා එක එක පක්ෂ එකතු කරගෙන ඡන්දයක් වෙනුවෙන් අටවාගත් පටු පෙරමුණක් හෝ සන්ධානයක් නොවෙයි. මේක පැහැදිලිවම මහජන ව්‍යාපාරයක්. මැතිවරණවලට පමණක් සීමා නොවූ පුළුල් මහජන ව්‍යාපාරයක්. ඒකට මෙතෙක් මේ රට පාලනය කළ හා මේ විනාශයට වගකිවයුතු කිසිම පක්ෂයක් හෝ ඒවායේ නායකත්වයේ සිටින කිසිදු දූෂිත නායකයෙක් එකතු කර ගන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. ඒත් ඒ හැම පක්ෂයකම හිටපු, ඡන්දය දීපු, බිම් මට්ටමේ ජනතාව, අපි ජාතික ජන බලවේගය වටා එකතු කරනවා. ඒ වගේම විවිධ පක්ෂවල හිටපු, පැරණි දේශපාලනයෙන් අවංකවම වෙන්වුණු අදූෂිත පුද්ගලයින්ටත් මෙහි ඉඩ තියෙනවා. පක්ෂවලට, පක්ෂවල නායකයින්ට සිංහාසන හදාදීපු යුගය නිමකරලා ජනතාව බලය අත්පත් කර ගන්නා, ජනතාවගේ පාලනයක් නිර්මාණය කළ හැකි ජනතා ව්‍යාපාරයක් ලෙස තමයි අපි මේ කාර්යය කරන්නේ.

***නියමුවා:-** හොඳයි මෙහිදී ඔබ මුහුණ දෙන අභියෝග හා ඔබේ පක්ෂයේ ඉදිරි ක්‍රියාමාර්ග පැහැදිලි කළොත්?*

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මම කලින් කිවුව වගේම අපි උත්සාහ කරන්නේ තවත් ධනපති ආණ්ඩුවක් අටවා ගන්න නෙමෙයි. මේ සමාජයේ පුළුල් හා ගැඹුරු සමාජ පරිවර්තනයක් කරන්න. වර්තමාන අර්බුදය අපෙන් ඉල්ලා සිටින්නේ එයයි. ඒක සරල පහසු කටයුත්තක් නොවෙයි කියලා අපි හොඳටම දන්නවා. මෙතෙක් රට පාලනය කළ මේ දූෂිත කණ්ඩායම් දෙකම මෙහිදී අපට එරෙහි විවිධ දේ කරනවා කියල අපි දන්නවා. අවලාද ගැසීම්, මඩ ගැසීම්, බිය වැද්දීම්, කඩාකප්පල්කාරී ක්‍රියා ආදී විවිධ ක්‍රියා ඔවුන් කරන බව අපි දන්නවා. ඒවාට සංයමයෙන් හා සවිඥානිකව මුහුණ දෙමින් යන්න අපිට පුළුවන්. අපේ පක්ෂය කියන්නේ දේශපාලනයේ බොහෝ අත්දැකීම් ඇති පක්ෂයක්.

අනෙක් අතට රටේ ජනතාවගේ පැරණි පුරුද්දේ බලය, සම්ප්‍රදායික සිතුම් පැතුම්, දිගු කාලීන සැබෑ පොදු විසඳුම් වෙනුවට එදා වේල ගතකර ගැනීමට පෞද්ගලික වාසි අපේක්ෂා කිරීම වැනි මිනිස් ස්වභාවයනුත්, අපිට අභියෝගයක් කියල අපි දන්නවා. ඒත් මිනිසුන් වෙනස් වන නිසා, වෙනස් කළ හැකි නිසා, විශාල අර්බුද කාලවලදී මිනිසුන් අත්දැකීම්වලින්ම ඉගෙන ගෙන වෙනස් වන නිසා අපි ජනතාව ගැන විශ්වාස කරනවා. ඒ වගේම පටු හා පෞද්ගලික අරමුණු සහිතව අපේ ව්‍යාපාරයට සමහරු සම්බන්ධ වෙන්න පුළුවන් කියලත් අපි දන්නවා. ඒත් දැනට අවංක අරමුණෙන් කිසිදු පෞද්ගලික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකර ජාතික ජන බලවේගය තුළ එකතු වී සිටින විශාල ප්‍රමාණයක් වූ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන

11 වැනි පිටුවට

> **ලස්සන ජීවිතයක් සුන්දර රටක් පැහැබර අනාගතයක් ප්‍රාර්ථනා කරන හැමදෙනාටම අප සමග අත්වැල් බැඳගන්නා ලෙස අපි ආරාධනා කරනවා.**

# අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධයේ දඩබිමක් වූ යුක්රේනය




යුක්රේනය හා රුසියාව අතර වර්ධනය වෙමින් තිබූ අර්බුදය රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් විසින් යුක්රේනයේ ඩොනෙට්ක්ස් හා ලුහාන්ස්ක් ප්‍රදේශ ස්වාධීන ජන රජයන් ලෙස පිළිගන්නා බවට ප්‍රකාශයට පත් කිරීමත් සමග නව අදියරකට පිවිසී තිබේ. මෙම ප්‍රදේශ දෙක යුක්රේනයේ ආණ්ඩු පාලනයෙන් මිදෙන්නේ 2014 වසරේදී යුක්රේනයේ ඇති වූ ආණ්ඩු පෙරළියෙන් පසුවය.

2014 වසරේ පෙබරවාරියේ දී එවකට යුක්රේන ජනාධිපති වූ වික්ටර් යුනුකොවිච්ගේ රුසියානු හිතවාදී පාලනය euromaiden නමින් හැඳින්වූ වර්ණ විප්ලවයක් මගින් පෙරළා දමනු ලැබිණි. මෙම ආණ්ඩු පෙරළිය පිටුපස එක්සත් ජනපදය සිටි බව තහවුරු වූ අතර එකී ආණ්ඩු විරෝධී විරෝධතාකරුවන්ගේ බල කර සිටියේ යුක්රේනය යුරෝපා සංගමයට හා උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයට සම්බන්ධ විය යුතු බවටය. ඉන්පසු එම වසරේදීම ක්‍රිමියාව ජනමත විචාරණයක් මගින් රුසියාව සමග එක් වීමට තීරණය කරනු ලැබිණි.

යුක්රේනයේ බලයට පත් වූ නව ආණ්ඩුව උග්‍ර ජාතිකවාදී, අන්ත දක්ෂිණාංශික හා රුසියානු විරෝධී  පාලනයක් විය. ඔවුන් යුක්රේනය තුළ ජීවත් වූ රුසියානු සම්භවයක් සහිත ජනතාව කෙරෙහි සතුරු ආකල්පයකින් කටයුතු කිරීමට පටන් ගැනීමත් සමග රුසියානු සම්භවයක් සහිත බහුතර ජනතාවක් ජීවත් වන ප්‍රදේශ සමග ගැටුම් වර්ධනය විය. මෙම පදනම මත බහුතර රුසියානු ජනතාවක් ජීවත් වන ඩොනෙට්ක්ස් හා ලුහාන්ස්ක් ප්‍රදේශයන්හි යුක්රේන පාලනයට එරෙහි හා රුසියානු හිතවාදී කැරලි කණ්ඩායම් බිහි විය. මෙම කැරලිකරුවන්ට රුසියානු ආධාර ලැබුණු අතර කෙටි කලකදී පෙර කී ප්‍රදේශයන්හි පාලනය කැරලිකරුවන් අතට පත් විය.

මෙම කැරලිකරුවන් හා යුක්රේන හමුදා අතර ගැටුම් වර්ධනය විය. පසුව 2015 පෙබරවාරියේදී මින්ස්ක් ගිවිසුම අත්සන් කරනු ලබන්නේ ඊට විසඳුමක් ලෙසය. කරුණු 13ක් මත පදනම් වූ එම ගිවිසුම මගින් ගැටුම් වහාම අවසන් කිරීමටත් ඩොනෙට්ස්ක් හා ලුහාන්ස්ක් ප්‍රදේශවලට වැඩි ස්වයං පාලන බලතල ලබා දීමටත්, පසුව ජනමත විචාරණයකට යාමටත් යෝජනා කෙරිණි. එහෙත් මින්ස්ක් ගිවිසුම නිසි ලෙස ක්‍රියාත්මක නොවුණු බැවින් යුදමය තත්වය එලෙසම පැවතිණි.

එක්සත් ජනපදය, රුසියාව NATO රාජ්‍යයන්ගෙන් වට කිරීමෙහි උත්සාහයක සිටී. යුක්රේනය තුළ වර්ණ විප්ලවයක් ඇති කරමින් එහි පැවති රුසියානු හිතවාදී පාලනය පෙරළා දමන්නේත් යුක්රේනයට නැටෝ සාමාජිකත්වය පිරිනැමීමට සූදානම් වන්නේත් එබැවිනි. නැටෝ සංවිධානය නැගෙනහිර දෙසට ව්‍යාප්ත කිරීම වහාම අත්හිටුවන ලෙස රුසියාව දිගින් දිගටම ඉල්ලා සිටියද එය සිදු නොවුණි. අන්ත දක්ෂිණාංශික, ජාතිකවාදී හා රුසියානු විරෝධී පාලනයක් පවතින යුක්රේනයට නැටෝ සාමාජිකත්වය පිරිනැමීම සිය ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස රුසියාව සලකයි. රුසියාව රුසියානු සම්භවයක් සහිත බහුතර ජනතාවක් ජීවත් වන යුක්රේනයේ ඩොනෙට්ක්ස් හා ලුහාන්ස්ක් පළාත් දෙක යුක්රේනයෙන් වෙන් කිරීමට මැදිහත් වන්නේ සිය ජාතික ආරක්ෂාව පැත්තෙන් සිතාය. මේ වන විට රුසියාව යුක්රේනයට එරෙහිව දියත් කර ඇති හමුදා මෙහෙයුම අවසන් වනු ඇත්තේ මෙම පළාත් දෙක රුසියාවට ඈඳා ගැනීමෙන් විය හැක. කෙසේ වුවද ඒ වෙනුවෙන් සමස්ත යුක්රේනයම යටත් කර ගෙන තමන්ට හිතවත් පාලනයක් ස්ථාපිත කරාවිදැයි යන්න මේ සටහන තබන මෙහොත වන විට නිශ්චිතව කිව නොහැක.

මෑත කාලීනව මෙම අර්බුදය තීව්‍ර වන්නේ පසුගිය වසරේ මාර්තු මාසයේදී පමණ රුසියානු හමුදා යුක්රේන දේශ සීමාව ආසන්නයේ රැස් කිරීම ආරම්භ කිරීමත් සමගය. 2021 දෙසැම්බරය වන විට රුසියානු සෙබළුන් 100 000ක් පමණ යුක්රේන දේශ සීමාව ආසන්නයේ ස්ථාන ගත කොට තිබුණි. ඒ සමගම එක්සත් ජනපදයේ මැදිහත් වීමෙන් රුසියාව යුක්රේනය ආක්‍රමණය කරන්නේයැයි දැවැන්ත මාධ්‍ය මෙහෙයුමක් ආරම්භ කෙරිණි. එක්සත් ජනපද ජනාධිපති බයිඩන් වර්ධනය වෙමින් පවතින තත්වය පිළිබඳ යුරෝපීය නායකයන් සමග සාකච්ඡා කල අතර රුසියානු ආක්‍රමණයක් ඕනෑම මොහොතක සිදුවිය හැකියැයි අනතුරු අඟවා තිබුණි. එය බොහෝ විට චීනයේ ශීත ඔලිම්පික් උළෙල පැවතෙද්දී සිදුවිය හැකියැයිද පසුව පෙබරවාරි 20ට පෙර සිදුවනු ඇතැයිද ආදී වශයෙන් ප්‍රචාරය කෙරිණි. එක්සත් ජනපදය මෙම යුද භීතිය මගින් යුක්රේනයට සැලකිය යුතු යුද ආයුධ ප්‍රමාණයක් අලෙවි කර ගත්තේය.

රුසියාවේ යුද ක්‍රියාමාර්ගයට ප්‍රතිචාර දක්වමින් එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය , යුරෝපා සංගමය රුසියාවට එරෙහිව සම්බාධක පැනවූ අතර ජර්මනිය නෝර්ඩ් ස්ට්‍රීම් 02 නල මාර්ගය ගොඩනැගීම අත්හිටුවීය. ආරක්ෂක මණ්ඩලයේ හදිසි රැස්වීමක් කැඳවනු ලැබුණු අතර යුක්රේන ආක්‍රමණය හෙළාදකිමින් සම්මත කරන ලද යෝජනාවට එරෙහිව රුසියාව නිෂේධ බලය යෙදවීය. කෙසේ වුවද මෙහිදී චීනය හා ඉන්දියාව යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ නොකිරීම කැපී පෙනේ. මේ අතර රුසියාව යුක්රේනය තුළ ගන්නා ලද යුදමය ක්‍රියාමාර්ගය ආක්‍රමණයක් වශයෙන් නොසලකන බව චීනය විසින්  ප්‍රකාශ කර තිබේ.

යුක්රේනය තුළ වර්ධනය වී ඇති යුදමය තත්වය ලෝක බලවතුන් අතර පවත්නා බල අරගලයේ ප්‍රකාශනයක් මිස අනෙකක් නොවේ. ලෝක බලවතුන්ගේ  ලාභ අරභයා සම්පත්, වෙළඳපොළ ආදිය සඳහා සිදු කරනු ලබන තරගයේ අවසාන ප්‍රතිඵලය යුද්ධයයි. එහිදී ඔවුන්ට එක් එක් රටවල ජනතාවගේ පරමාධිපත්‍යය, ස්වාධීනත්වය, ස්වෛරීභාවය, අයිතිවාසිකම් හෝ නිදහස වැදගත් සාධක නොවේ; ඒවා තම ක්‍රියාමාර්ග සාධාරණීකරණය කිරීම සඳහා පාවිච්චි කළ හැකි සටන් පාඨ පමණි. යුද්ධය යනු දේශපාලනය වෙනත් ආකාරයකින් එනම්, ප්‍රචණ්ඩ ආකාරයකින් කරගෙනයෑම යැයි ලෙනින් විසින් පවසා තිබේ. මෙම යුද්ධය සිය ආර්ථික හා බල ආධිපත්‍යය සඳහා ලෝක බලවතුන් අතර කෙරෙන්නා වූ යුද්ධයක් පමණි. එබැවින් මේ මොහොතේදී එක්සත් ජනපදය විසින් සිය බල වුවමනාවන් සඳහා රුසියාව නැටෝ රාජ්‍යයන්ගෙන් වට කිරීමට ගන්නා වූ උත්සාහයද රුසියාව විසින් ඩොනෙට්ක්ස් හා ලුහාන්ස්ක් ප්‍රදේශ ඈඳා ගැනීමට ගන්නා වූ උත්සාහයද අනුමත කළ නොහැකිය. එසේම රුසියාව යුක්‍රේනයට කඩා වැදීම වැරදිසේම රුසියාව කොටු කිරීමට නෙටෝ රටවල් විසින් යුක්‍රේනය යොදාගැනීමට දරන උත්සාහය හා යුක්‍රේනය ඊට යටවීමද එක සේ වැරදිය.

මේ ප්‍රකාශයට පත් වෙමින් තිබෙන්නේ අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධයේ වත්මන් තත්වයයි. යුද්ධය අධිරාජ්‍යවාදයේ ලක්ෂණයක් වන බැවින් එය පරාජය කළ හැක්කේ අධිරාජ්‍යවාදය පරාජය කිරීමෙන් පමණි.

## ඉතාලිය: සූරාකෑමට එරෙහිව ශිෂ්‍ය උද්ඝෝෂණ




පසුගිය පෙබරවාරි 18වනදා ඉතාලියේ සිසුහු දස දහස් ගණනක්, නගර 40කට වැඩි ප්‍රමාණයකදී, ඉතාලියේ රාජ්‍ය අධ්‍යාපන ක්‍රමයට සහ ඉතාලියානු තරුණයන් නොසලකා හැරීමට එරෙහිව විරෝධතාවන්හි යෙදුනහ. 2015 වසරේ සිට ඉහළ පාසල් වල සිසුන් සඳහා අනිවාර්ය කර ඇති සීමාවාසික පුහුණුව යටතේ සමාගම්වලට සිසුන්ගේ ශ්‍රමය අඩු මුදලට සූරාකෑමට ඉඩ ලබාදීමට එරෙහි වීමත් එකී සීමාවාසික වැඩ අතරතුරදී මිය ගිය සිසුන් දෙදෙනාගේ මරණවලට විරෝධය පළ කිරීමත් මෙම උද්ඝෝෂණයන්ගේ මූලික අරමුණ වී තිබිණි.

## ලක්සම්බර්ග්: තැපැල් සේවකයෝ විරෝධයේ




ලක්සම්බර්ග්හි තැපැල් සේවකයෝ පසුගිය පෙබරවාරි 19වැනිදා එරට තැපැල් ගාස්තු ඉහළ දැමීමට එරෙහිවත් රජයේ තැපැල් කාර්යාල වසා දැමීමට එරෙහිවත් විරෝධතාවක යෙදුනහ. මෙම විරෝධතාව සංවිධානය කර තිබුනේ ලක්සම්බර්ග 'හි කොමියුනිස්ට් පක්ෂය සහ තවත් වෘත්තීය සමිති කිහිපයක් විසිනි. ලක්සම්බර්ග්හි රාජ්‍ය සමාගමක් වන Post Luxembourg සමාගම විසින් පසුගිය වසරේ ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි තැපැල් ගාස්තු ඉහළ දමා තිබූ අතර ඒ පිළිබඳ ජනතාව නිසි ලෙස දැනුවත් කර නොතිබීම හේතුවෙන් ජනතා විරෝධයට ලක්වී ඇත.

## අප්‍රිකාව: එන්නත්කරණය සිහිනයක් වී



කොවිඩ් 19 රෝගය සඳහා එන්නත්කරණයේදී ලෝකයේ අඩුම ප්‍රතිශතයක් එන්නත් කර ඇත්තේ අප්‍රිකානු මහද්වීපයෙන්යයි වාර්තා වේ.

අප්‍රිකානු මහද්වීපයේ සමස්ත ජනගහනයෙන් තවමත් පූර්ණ ලෙස එන්නත් කර ඇත්තේ 13%ක් පමණි. අප්‍රිකානු මහද්වීපයේ රටවල් 03ක් තවමත් එන්නත් කර ඇත්තේ ජනගහනයෙන් 1%කට වඩා අඩුවෙන් වන අතර තවත් රටවල් 18ක් එන්නත් කර ඇත්තේ ජනගහනයෙන් 10%කට වඩා අඩුවෙනි.

## බ්‍රිතාන්‍යය: කප්පාදුවට එරෙහිව කම්කරු විරෝධතා




ජීවන වියදම ඉහළ දැමීමට එරෙහිව බ්‍රිතාන්‍යයේ කම්කරුවන් ප්‍රමුඛ ජනතාව පෙබරවාරි 12 වනදා රට පුරා නගර ගණනාවක විරෝධතාවයෙහි යෙදුනහ.

මෙම විරෝධතාව සංවිධානය කර තිබුණේ 'කප්පාදුවට එරෙහි මහජන සභාව' නමැති පොදු සංවිධානයක් විසිනි. එහිදී උද්ඝෝෂකයෝ ඉන්ධන මිල වහාම අඩු කරන ලෙසටත් වැඩිවූ ජීවන වියදමට සරිලන සේ වැටුප් සහ අනෙකුත් පහසුකම් වැඩි කරන ලෙසටත් බල කර සිටියහ.

# අඳුරේ ගිලෙන ආර්ථිකය සහ කඩාවැටෙන ජන ජීවිත

අද ශ්‍රී ලංකාව, වැඩි පැය ගණනක් අඳුරේ සිටින, විදුලිය නැති, පොහොර නැති, ඉන්ධන නැති, පාසල් විවෘත නැති, කොරෝනා ඉවරයක් නැති රටක් බවට පත්වී හමාරය.

කොරෝනා පැතිරෙද්දී තාම සමාජගත වී නැතැයි කීවා සේ, මේ සියලු අර්බුදයන් පාලකයන්ට අනුව තවම ප්‍රශ්නයක් නැතිය. නමුත් ජනතාවට ප්‍රශ්න එමටය. ආණ්ඩුවේ ඇමතිවරයා කියන්නේ, ජනතාව තෙල් හිඟ වේ යැයි බයට ටැංකි පිරෙන්න තෙල් ගහන නිසා තෙල් හිඟ බවය. ඒ නිසා ෆුට් බයිසිකලයෙන් වැඩට එන එක ඇඟට ගුණ බවය. ඒ උපදෙස් දෙන ඇමතිවරුම වාහන පිරිවරා පාර්ලිමේන්තුවට යන්නේ, ජන දුක ගැන වාද කරන්නටය. ෆුල් ටැන්ක් ගහන නිසා තෙල් හිඟ නම්, ෆාමසිවල බෙහෙත් හිඟ වී ඇත්තේ බෙහෙත් හිඟ වේ යැයි සැකයට ෆාමසිවල බෙහෙත් ඔක්කොම ජනතාව බීලා දැයි අහන්නට කැමරාව ඉදිරියේ මාධ්‍යවේදියෙක් නැත්තේය. ඒ මාධ්‍යවේදියාගේ දවසේ ගතමනාවට ඕනෑ කැල්ල ඇමතියා ආතල් එකට කියන නිසාය. පොහොර නැතිව අස්වැන්න අඩුවී ඇතැයි ජනතාව ජනාධිපති ගෝඨාට කියන විට ජනාධිපති කියන්නේ, "මම කියන දේ අහන්නකෝ, පෝර නොමිලේ දුන්නා, මතක නැතිද"යි කියාය. ජනාධිපති, ජනතාවට කියන්නේ නොමිලේ පොහොර දුන් අතීත ශ්‍රී විභූතිය මතක තියාගෙන බඩගින්නේ ඉන්න කියාය. ජනතාවට බඩගින්නට දිරවා ගන්න බැරි තරමට ආණ්ඩුව විහිළු සපයනවාය.

## ඩොලර් අර්බුදය


දැන් ඩොලරය, හාල්, කිරිපිටි, පාන්පිටි, විදුලිය, ගෑස්, තෙල් වගේම සාමාන්‍ය ජනයා අතරේ කතාබහ වෙන වචනයක් වෙලා ඉවරය. ඩොලර් අර්බුදය, විදේශ සංචිත, ගමේ පුංචි බණ්ඩා මාමාද මේ ඩොලර් විදේශ සංචිත අර්බුදය ගැන අහන්නේය; කියවන්නේය; දන්නේය.

2015 දී ඩොලර් මිලියන 7304ක්ව පැවැති විදේශ වත්කම් සංචිතය 2021 නොවැම්බර් අවසානය වන විට පැවැතියේ ඩොලර් මිලියන 1600ක මට්ටමට පහළට වැටිලා; 2022 ජනවාරි මාසයේදී ඩොලර් මිලියන 500ක විදේශ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර කල් පිරෙන ගනුදෙනුව පියවා ගැනීමෙන් පසු දැන් තත්වය ඉතාමත් අවදානම අඩියට වැටී අවසන්ය.

මේ වන විට විදේශ ඩොලර් හිඟය කොතරම් අර්බුදයට ගොස් ඇත්තේදැයි තේරුම් ගැනීමට මේ දිනවල පවතින ඉන්ධන අර්බුදයේ ස්වභාවය වටහා ගැනීම ප්‍රමාණවත්ය. ඉන්ධන නැතිවීම ඉන්ධන වැඩිපුර භාවිතා කිරීමේ කලබලයක් නිසා නොවේය. ඒ ඉන්ධන ලබා ගැනීමට ඩොලර් නැති නිසාය. ඩොලර් හිඟකම නිර්මාණය වී ඇත්තේ හේතු ගණනාවක් නිසාවෙනි. ඉන් ප්‍රධානම වන්නේ ආදායම මෙන් දෙගුණයක් වියදම දැරීමය. අපනයන ආදායමේ වැඩිම පංගුව ආනයනය කරන අමුද්‍රව්‍ය වන ඇඟලුම් මත සකස් කරන නිෂ්පාදනය. ඒ නිසා අවසාන ශුද්ධ වටිනාකමක් ආර්ථිකයට එකතු කර නැත. එසේ වුවත් අපනයන ආදායම මෙන් ආනයන වියදම දෙගුණයකට ආසන්නය. 2021 දී ලංකාවේ අපනයන ආදායම ඩොලර් බිලියන 12.5ක් වෙද්දි ආනයන වියදම ඩොලර් බිලියන 20.1 විය. ඒ අනුව විදේශ වෙළඳාමේ හිඟය ඩොලර් බිලියන 8.1 විය.

එම වෙළඳ ශේෂ හිඟය බොහෝ විට පියවා ගත්තේ, සංචාරකයින්ගේ හා විදේශීය ශ්‍රමිකයන්ගෙන් ලැබෙන සෘජු ආදායම මගිනි. දැන්, කොරෝනා තත්වය යටතේ ඒ ආදායම ලැබූ පාරවල්ද වැසී ගොසිනි. විදෙස් ගත ශ්‍රමිකයන් ලංකාවට එවන මුදල් ප්‍රමාණය විශාල වශයෙන් අඩු වී ද තිබේ. ඇමතිවරුන්ගේ විකාර විහිළු කතා නොව අර්බුදයට එක් ප්‍රධාන හේතුවක් වනුයේ, ආදායම ඉක්මවන දෙගුණයක් පමණ වන වියදම වැඩිවීමය. එක්කෝ ආදායම ඉහළ දැමීමට සැලැස්මක් අවශ්‍යය. නැතිනම් වියදම පාලනයට ක්‍රමානුකූලව සැලැස්මක් අවශ්‍යය. නමුත්, විදුලිය කපන, ඉන්ධන නැති, පොහොර නැති වත්මන් යථාර්ථය හමුවේ දිගුකාලීන සැලසුම හා වියදම පාලනය කිරීම හිතළුවක් පමණය.






> ඇමතිවරුන්ගේ විකාර විහිළු කතා නොව අර්බුදයට එක් ප්‍රධාන හේතුවක් වනුයේ, ආදායම ඉක්මවන දෙගුණයක් පමණ වන වියදම වැඩිවීමය. එක්කෝ ආදායම ඉහළ දැමීමට සැලැස්මක් අවශ්‍යය. නැතිනම් වියදම පාලනයට ක්‍රමානුකූලව සැලැස්මක් අවශ්‍යය. නමුත්, විදුලිය කපන, ඉන්ධන නැති, පොහොර නැති වත්මන් යථාර්ථය හමුවේ දිගුකාලීන සැලසුම හා වියදම පාලනය කිරීම හිතළුවක් පමණය.

## එළයට පහර දී හේතුව මගහැරීම

මේ අර්බුදයන් ජනිත කළ, මේ ක්‍රමය කර තියාගෙන යන විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂය හා වර්තමාන සජිත් කණ්ඩායමද කරන්නේ මේ සමාජ ක්‍රමයේ නොහැකියාව ප්‍රශ්න කරනු වෙනුවට ක්‍රමයේ අර්බුදය විසින් ජනිත කළ දෛනික ප්‍රශ්නවලට පහර දීමය. විටෙක සුදුලූණු වංචාවය. සතොස සීනි බදු වංචාවත්ය. ඊළඟට ගෑස් හිඟය නිසා ගෑස් පොලිම්ය. ගෑස් ටැංකි පිපිරීමේ සංදර්ශනය. එවිට මාධ්‍යවල එදාවේලට ප්‍රවෘත්තිද ඒවාය. පාරිභෝගික භාණ්ඩ හිඟයද එලෙසමය. දැන් අලුත්ව මාතෘකාව විදුලිය කප්පාදුව, ඉන්ධන හිඟයයි. ගෑස් ගැන සාකච්ඡාව මේ දිනවල යට ගිහින්ය. ගෑස් වෙනුවට සුපිරි වෙළඳපොළටද දර ඇවිත්ය. පුංචි දර මිටියක් රුපියල් 200කට මිලදී ගෙන යාම ෆැෂන් එකක් කරගෙන සැනසෙන මධ්‍යම පංතියක්ද බිහිවී ඇති සැටිය. ආණ්ඩුව අර්බුදයේ ඇත්ත හේතු යට ගැසීමටම තවත් අර්බුද හදා පෙන්වන්නේදැයි හිතෙන තරමට දෛනිකව අර්බුදයන්ය. දැන් සැරසෙන්නේ ටොන් එකකට වැඩිපුර ඩොලර් 100ක් ද ගෙවා මියන්මාරයෙන් සහල් ගෙන්වීමටය.

අර්බුදය වෙනුවට ඊළඟට වියට්නාම් සහල් ගැන සාකච්ඡාවක් විපක්ෂයේ කට්ටියට පාර්ලිමේන්තුවේ ඇදගත හැකිය. මියන්මාරය වෙනත් රටවලට ටොන් එකක් ඩොලර් 330ට විකුණන සහල් ලංකාවට විකුණා ඇත්තේ ටොන් එකක් ඩොලර් 440ටය. එය මහත් අපරාධයක් ලෙස අල්ලාගෙන සහල් ඇමතිගේ අඩු කැඩිය හැකිය.

මේ අර්බුදයේ ප්‍රතිඵල ගලා යන ආකාරයයි. හේතුව සොයා යාමේදී දැකිය හැකි ප්‍රධාන කරුණ වන්නේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටීමයි. ආර්ථිකයට දරාගත නොහැකි ණය අර්බුදයයි. ණයවලද විශේෂය ලංකාවට දරාගත නොහැකි ලෙස මෑත කාලයේදී ඉහළ ගිය විදේශ ණය පංගුවය. එහිද මේ වන විට ඇත්තේ කොන්දේසි විරහිත ලෙස ගෙවිය යුතුව ඇති විදේශ ජාත්‍යන්තර බැඳුම්කර ණය පංගුව විශාල වීමයි. මෙහි සඳහන් වගුව මගින් විදේශ ණය අර්බුදයේ ස්වභාවය කදිමට දක්වා තිබේ. මෙහි 1999 සිට 2007 දක්වා වැඩිපුරම ලංකාව ලබාගෙන ඇත්තේ ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය ණයයි. නමුත්, 2007න් පසු දැක්වෙන්නේ මූල්‍ය වෙළඳපොළේ ඉහළ පොලියට ණය ගැනීමේ යුගයයි. එය පටන් ගැනෙන්නේ වත්මන් රාජපක්ෂට පෙර ප්‍රධාන රාජපක්ෂගේ යුගයේදීය. එය රටට අහිතකර වූවාට පාලකයින්ට ඉතාම ප්‍රියමනාප ණය ක්‍රමයයි. කලින් ණය කොන්දේසි සහිතය. පොලී සහ ගෙවිය යුතු කාලය දිගය. මූල්‍ය වෙළඳපොළේ ණය කොන්දේසි ලිහිල්ය; පොලිය ඉහළය.

2011න් පසු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට රහවැටීමේ ප්‍රතිඵල ජනතාව භුක්ති විඳීමට සිදුවී ඇත්තේ දැන්ය. දැන් මුළු විදේශ ණයවලින් 50%ක්ම මූල්‍ය වෙළඳපොළේ ණය වන අතර එයින් අඩකට වැඩියෙන් ජාත්‍යන්තර බැඳුම්කර මගින් ලබා ගත් ණයයි. එම ණය කල්පිරෙන්නේ 2020 සිටය. 2030 වන විට ගෙවිය යුතු ප්‍රමානය ඩොලර් බිලියන 13කි. ආර්ථිකය කඩාවැටෙන විට කල්පිරීමේදී එම බැඳුම්කර සඳහා ද්විතීය වෙළඳපොළේ ඉල්ලුමද පහළ වැටේ. ඒ නිසා එම ණය අත ඇති ගජමිතුරන්ටද මේ මොහොතේ ගජවාසි ලබා ගැනීමට හැකිය. මුළු ඩොලර් වත්කම් මිලියන 1000ක්ව තිබියෙදී, එයින් 500ක්ද ගෙවා පියවන්නේ ඒ නිසාය. ජනවාරි අවසාන වන විට රත්‍රං තොගයද ඇතුළු (ඩොලර් මිලියන 382ක්) මුළු

11 වැනි පිටුවට



"සාමාන්‍ය නිද්‍රාශීලී ජීවිතයේදී ජනතාව අවුරුද්දකින් උගෙන ගන්නවාට වඩා දෑ විප්ලවයක් අතරතුර එක් සතියකදී ඔවුහු උගෙන ගනිති. එසේ වන්නේ, මුළු ජනතාවගේම ජීවිතයේ තියුණු වෙනස්වීමක අවස්ථාවේදී, ජනතාවගේ විවිධ පංති අනුගමනය කරන අරමුණුද, ඒවාට ඇති ශක්තියද, ඒවා උපයෝගී කරගන්නා ක්‍රමද ඉතාමත් පැහැදිලි වන හෙයිනි."

**ලෙනින්**

**තෝරා ගත් කෘති, වෙළුම 05, පිටුව 198**




# අපි සූදානම් ඔබ?

කාන්තා දිනය රිදී බන්දේසියක තබා කාන්තාවන් වෙත ප්‍රදානය කෙරුන දිනයක් නොවේ. එය වැඩ කරන කාන්තාවන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් අපමණ කැපකිරීම් හා අධිෂ්ඨානශීලී අරගලයන් හා සුවහසක් කාන්තාවන්ගේ ලෙයින් දහඩියෙන් දිනාගනු ලැබූවකි.

ජාත්‍යන්තර කාන්තා දිනය ආරම්භ වීමට මුල් වූයේ ඉතිහාසයේ කාන්තාවන් තම අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් කරන ලද අරගලයන්ය. 18 වන සියවසේ යුරෝපයේ හා උතුරු ඇමෙරිකාවේ කාර්මික දියුණුවත් සමග ඇරඹුණු රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තශාලාවල වැඩ කළ ගැහැනුන්ට විඳින්නට සිදු වූ ගැහැට මේ සඳහා වස්තු විෂය විය. මෙම කර්මාන්ත ශාලාවල ඉතා සුළු වැටුපකට පැය 14ක් 16ක් වැනි ඉතා දිගු කාලයක් සේවය කරමින් දුෂ්කර හා අනාරක්ෂිත ජීවිත ගත කළ කම්කරු කාන්තාවන් 1908 වර්ෂයේ නිව්යෝර්ක් නගරයේදී දියත් කළ දැවැන්ත උද්ඝෝෂණ පා ගමනක් පදනම් කර ගනිමින් ජාත්‍යන්තර කාන්තා දිනය බිහිවීමට මූලික අඩිතාලම යෙදුනු බව ඉතිහාසයේ සඳහන් වේ. 1910 ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නගරයේ පැවති සමාජවාදී කාන්තාවන්ගේ දෙවන ජාත්‍යන්තර සමුළුවේදී ජර්මන් ජාතික සමාජවාදී නායිකාවක වූ ක්ලාරා සෙට්කින්ගේ යෝජනාවක් හා සුයිස් සියෙට්ගේ ස්ථිරත්වයෙන් ජාත්‍යන්තර කාන්තා දිනයක් පිළිබඳ වූ ඉල්ලීම ඒකමතිකව සම්මත විය.

ඒ අනුව ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය, ජර්මනිය හා ස්විට්සර්ලන්තය වැනි රටවල් 1911 දී "පාන් සහ සාමය" ඉල්ලා රුසියානු කාන්තාවන් සිදු කළ වැඩවර්ජනය පැවති දිනය වූ මාර්තු 08 දිනය ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලබන දිනය බවට පත්විය. 1975 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය එයට නිල පිළිගැනීමක් ලබාදෙනු ලැබූ අතර 1945 දී කාන්තාව සහ පුරුෂයා සමානත්වයෙන් යුතු බව තහවුරු කිරීමේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් ද 1995 බීජිං ප්‍රකාශයෙන්ද ලොව සෑම කාන්තාවකටම තම කැමැත්ත පරිදි ජීවත්වීමේ අයිතිය තහවුරු කරන ලදී.

එවන් අරගලකාරී, සටන්කාමී ඉතිහාසයක් හරහා අප හමුවට එන ජාත්‍යන්තර කාන්තා දිනය වර්තමානයේ සමරනු ලබන්නේ කෙලෙසින් ද? එදා ක්ලාරා සෙට්කින්ලා සටන් කොට ලබාගත් දිනයක ඇති වටිනාකම හෝ නොදැන එහි සැබෑ අරුත නොහැඳිනගෙන කාන්තා දිනයේ අර්ථය විකෘති වන ලෙස පවත්වන සැමරුම් බොහොමයක් දක්නට ලැබීම ඛේදජනකය.

සියවසකට එපිට යුරෝපා සමාජයේ කම්කරු කාන්තාව විඳි ගැහැටවලින් වර්තමාන කාන්තාව මිදී ඇත් ද? කිසිසේත් එය එසේ නොවේ. සියවසකට පසු වර්තමානයේදීත් කාන්තාවන් විඳින දුක තවත් සිය දහස් ගුණයකින් වැඩි වී ඇති වා මිස කිසිදු ප්‍රශ්නයකට විසඳුම් ලැබී නැත.

විශේෂයෙන් වර්තමාන ලාංකේය සමාජයේ කාන්තාවන්ට විඳින්නට සිදුවෙන බොහෝ ප්‍රශ්න වෙනත් රටවල කාන්තාවන්ගෙන් බහුතරයකට විඳින්නට සිදුනොවනු ඇත. ආසියාතික පසුගාමී සමාජයක ජීවත්වන ලාංකීය කාන්තාව සමාජ ආර්ථික හා දේශපාලනික වශයෙන් බැට කමින් තම ජීවන අරගලය තුළ අනවරත අරගලයක යෙදෙයි. ඇය ජීවිතය විඳිනු වෙනුවට ජීවිතය විඳවයි. සතුටු මුහුණක් වෙනුවට ඇයට ඇත්තේ ඉකිබිඳින හදවතකි. ලොව පළමු කාන්තා අගමැතිනිය බිහිවූ රටක කාන්තාවන් ජනාධිපති වූ රටක කාන්තාවන් තවමත් ජීවත් වීම උදෙසා දහදක් විඳිමින් හිඳියි. බඩවියත රැකගැනීම වෙනුවෙන් පැය ගණන් පෝලිම්වල දුක් විඳියි. පාතාලයේ ගොදුරු බවට පත්වී මහමඟ මිය යන්නට සිදුවෙයි. ජීවත්වීම උදෙසා අන් මගක් නොවූ තැන මත්ද්‍රව්‍ය විකුණන්නටත් ඒ නිසාම සිර ගෙවල්වල දුක් විඳින්නටත් සිදුවෙයි. මව්බිමෙන් පිළිසරණක් නොමැති කල, සරණක් සොයා විදෙස් ගතවී වැලි කතරේ අතරමං වෙන්නට සිදුවෙයි. මහ රෑ අලි ගම්වදින විට කළුවරේ දිවි බේරා ගන්නට කැලෑ වදින්නට සිදුවෙයි. දිය පොදක් සොයා සැතපුම් ගණන් පයින් ගමන් කරන්නට සිදුවෙයි. මේ කාන්තා දිනය දිනාගෙන වසර 112කට පසු ලාංකේය සමාජයේ කාන්තාවන්ට හිමි තත්ත්වයයි.

ඉඳින් අපි කාන්තා දිනය සමරනු වස් මනාලියන් දැක්මක්, කේක් ප්‍රදර්ශනයක් විලාසිතා දැක්මක් හෝ ඉවුම් පිහුම් තරගයක් පවත්වා කාන්තා දිනය සමරන්නට හිත හදා ගන්නට අපට පුළුවන් ද? සියල්ල සම්පූර්ණ වූ සමාජයක සියලු ප්‍රශ්න විසඳී ඇති සමාජයක කාන්තාවක් සතුටින් සිටින සමාජයක එවන් අරුමෝසම් උත්සව පැවැත්වීම කළාට කම් නැත. නමුත් සියල්ල උඩු යටිකුරු වූ සමාජයක තව තවත් කාන්තාවන් මුලා කරන ආටෝපයන්ට වඩා ඇගට අවශ්‍ය වන්නේ ඇය විඳින දුක් ගැහැටවලින් මිදීමට හැකි මාවතක් පෙන්වාදීමයි. ඒ මාවතේ අතරමං නොකොට ඇය කැඳවාගෙන යා හැකි ශක්තිමත් අත්වැලකි.

එවන් මඟක් වෙත ලාංකීය කාන්තාව යොමු කිරීමට 73 වසරක් පුරා රට පාලනය කළ පාලකයන් සමත් වූයේ නැත. එනිසා එදා මෙන්ම අදත් උදෑසන පටන් රාත්‍රිය වෙනතුරුත් කාන්තාවන් දුක් ගැහැට විඳියි. බස් රියේ තෙරපී පොඩිවී වැඩට යයි. දුවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට වෙහෙසෙයි. දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථානවල රඳවා සුසුම්ලයි. අඳුරත් සමග ගෙට ඇවිදින් පසු දිනට සූදානම් වෙයි. ඇයට වෙනත් ජීවිතයක් නැත. ඇය මේ පීඩනයන් සියල්ල තම සැමියා දරුවන් හා නිවැසියන් මතින් මුදා හරිනු ලබයි.

ඇයට සමාජ ජීවිතයක් ගත කරන්නට අනාගතයක් නැත. සතුටින් පවුල් ජීවිතයක් ගත කරන්නට හැකියාවක් නැත. මානසික සුවයකින් ගෙවන වෘත්තීය ජීවිතයක් ඇයට නැත. නමුත් වසර 111ක් පුරා ඇය කාන්තා දිනය සමරා තිබේ. රටේ පාලකයන් කාන්තා දිනයට ඇය වෙනුවෙන් සුබ පැතුම් එක් කරයි. රටේ බැංකු ඇය වෙනුවෙන් බැංකු ගිණුම් විවෘත කරයි. මාර්තු මාසයම කාන්තාවන්ට සහනයක් ලැබුණා දැයි සොයා බලන්නට කාන්තා කටයුතු භාර ඇමතිවරියන්ට හෝ වුවමනාවක් තිබුණේ නැත.

මේ සා විශාල බර පොදියක් දරාගන්නා කාන්තාවන්ගේ බර සැහැල්ලු කරන්නට හැකි වූ දිනට ඇයට සැබෑ ලෙසම කාන්තා දිනය සමරනු හැකි වනු ඇත. ඒ වෙනුවෙන් සමාජවාදී කාන්තා සංගමය ලෙස අද දවසේ සුවිශාල කාර්යභාරයකට උරදී සිටියි. තමන් දුක් විඳින බව නොදන්නා කාන්තාවන්ට එයින් මිදීමේ පහසුව පෙන්වා දීමටත් අපට සිදුව තිබේ. සැබෑ ලෙසම කාන්තාවන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාගත හැක්කේ පවතින සමාජ ක්‍රමය වෙනස් කිරීමෙන් පමණකි. එසේ නොකර කිසිදු ප්‍රශ්නයකට පිළිතුරක් සොයනු නොහැකිය. එබැවින් මෙවර කාන්තා දිනයේදී අපේ අරමුණ තවදුරටත් සුපැහැදිලි විය යුතුය. එනම් සියලු කාර්යයන් නාභිගත විය යුත්තේ සමාජය වෙනස් කිරීමේ අරමුණින් පමණකි. ඉන් මෙපිට කාන්තාවන්ට පිළිතුරක් නැත.

එදා සමාජවාදී නායිකාවන් අපට පෙන්වූ මාවත එයයි. සමාජවාදයෙන් තොරව කාන්තා විමුක්තිය පිළිබඳ කතා කිරීම අර්ථ විරහිත බව සමාජයට අපට නැවත නැවතත් ඔප්පු කරමින් හිඳියි. එසේ නම් අපි තවත් ප්‍රමාද විය යුතු නැත. සමාජය වෙනස් කිරීමේ මාවත තෝරාගත් කාන්තාවන් විසින් අනෙකුත් කතුන්ටද මාවත පෙන්වා දිය යුතුව තිබේ. ඒ වෙනුවෙන් දැනුම ලබා ගැනීමටත්, ලබාගත් දැනුම සමාජ වෙනසක් වෙනුවෙන් උපයෝගී කර ගැනීමටත් මෙවර කාන්තා දිනය වෙනුවෙන් අධිෂ්ඨාන කරගත යුතුය. ඒ සඳහා නිබඳ මඟ පෙන්වන්නට අපි සූදානම් බවද ඔබට හඬ ගා කියමු.



## දැන් ඕනෙම කොන්ද

කහට බැඳුණු දත්වල මල් සිනායා
කහට දෑත්වල රැඳි නෙක රටායා
රටට බත පිණිස වැඩ බර දරායා
නුඹට හෙටක් ගැන අරුණලු පිපේයා

වෙලේ පැලේ හේනේ දුක් වින්ද සකී
ඇලේ දොළේ දුක සෝදා හැරිය හැකී
වින්ද දුකට වග පල කිසිදාක නොකී
කටුක යහන් මත සැඟවී යාද මැකී

කළු ගල් වුවත් කඳුලින් දියකර හරින
දිරි ඇති කතුනි දිවි ඇති තෙක් දුක විඳින
පමා නොකර අරුණට ඉණිමං තනන
නවෝදයට කවුළුව සැනෙකින් අරින

සොඳුරු මැදුරු මළ නොබැඳී දිළිසෙද්ද
අඳුරු නපුරු අහුමුළු කොතනත් ඇද්ද
කඳුරු රසට පැණි කෑ නොකරම සද්ද
රුදුරු බර පොදිය තවමත් බර නැද්ද?

මග තොට ගැහැට උදයේ හවසත් වින්ද
අඟහිඟ මිසක සතුටක් නැත්තේ මන්ද
උසුලන බර පොදිය මත දියකර නින්ද
විඳවන ගැහැනුන්ට දැන් ඕනෙම කොන්ද

# අඳුරට එරෙහිව සත්‍යය වෙනුවෙන් අරගල කරමු

සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා
සමන්මලී ගුණසිංහ සහෝදරිය



111 වැනි ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මොහොත උදා වන විටත් ලෝක පරිමාණව කාන්තාවන් වෙත එල්ල වන පීඩනය ඉහළ යමින් පවතිනව එකට ජාතිකව මෙන්ම ජාත්‍යන්තරවත් ඕනෑ තරම් උදාහරණ දෙන්න පුළුවන්. මේ වෙනකොට අපේ නිවස තුළ මෙන්ම රටේ ආර්ථිකයේද වැඩිම බරක් දරන්නේ කාන්තාවන්. එහෙත් වර්තමානයේ ඇති වී ඇති ආර්ථික කුණාටුවෙන් ගොදුරක් බවට පත්ව ජීවිතය විඳවීමටද සිදුවී ඇත්තේ ඇයටයි. රටේ සමෘද්ධිය හා සෞභාග්‍යයේ අයිතිය පාලකයා විඳිනවා. එහෙත් රටේ කාන්තාවෝ කුප්පි ලාම්පු එළියෙන් ජීවිතයේ අඳුරම පමණක් විඳවනවා. සොරා කන ආර්ථික මොඩලයේ අලිබබා සහ හොරු 40 අලුත් වටයකින් කාන්තාවෝ රැවටීමට, 'වැඩ දහසක් බොරු දහසක්' යනුවෙන් ව්‍යාපෘතියක් ආරම්භ කරලා. ජනතාව බොරුවෙන් රවට්ටන එක පාලකයින්ගේ ජාන ලක්ෂණයක් වුවද රැවටෙන එක කාන්තාවන්ගේ ජාන ලක්ෂණයක් නම් කරගන්න එපා. රටක් වෙනස් කළ හැකි වන්නේත් රට අලුතෙන් මාවතකට හැරවිය හැක්කේත් අලුතෙන් සිතන, රැවටෙන්නේ නැති, ධෛර්යවන්ත ගැහැනියටම පමණයි. ඉතින් අපි අඳුරට එරෙහිව සත්‍යය වෙනුවෙන් අරගල කරන ආදරණීය ගැහැනියක් වෙමු.

2022 පෙබරවාරි 09

# ආර්ථික අර්බුදයේ ලොකුම වන්දිය ගෙවීමට සිදු වී තිබෙන්නේ **දුප්පත්ම මිනිසුන්ටයි**

*(අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)*

*පාර්ලිමේන්තු මන්ත්‍රී*
*ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය*

අධිකරණය තුළ කාර්යක්ෂමතාව දියුණු කිරීමට සහ අධිකරණය වඩාත් ජනතාවාදී අධිකරණයක් බවට පත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ගවලට අපේ සහයෝගය ලබා දෙන්න අපි ලෑස්තියි. ඒ ගැන කිසි විවාදයක් නැහැ. අධිකරණය තුළ තිබෙන අඩුපාඩු නිසා, ඒ කියන්නේ යම්කිසි විධියකට නඩු විමර්ශනය කිරීමේදී අධික කාලයක් ගතවීම නිසා සිදුවන අපහසුතා ගැන අපට ඕනෑ තරම් වාර්තා වෙනවා. එමනිසා මීට වඩා කාර්යක්ෂමව අධිකරණ සේවාව ක්‍රියාත්මක කිරීම සඳහාත්, එහි තිබෙන අඩු පාඩු නිවැරදි කිරීම සඳහාත් මේ ගන්නා ක්‍රියාමාර්ගවලට අපේ සහයෝගය ලැබෙනවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ.

නමුත් අපට පිළිගන්න වෙනවා, මේ වෙනකොට අපේ අධිකරණය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න අතර පරිපාලනමය ගැටලු වාගේම, දේශපාලන ගැටලුවකුත් තිබෙන බව. අධිකරණය පිළිබඳ විශ්වාසය, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ විශ්වාසය ගැන ජනතාව අතර විශාල ගැටලු රාශියක් මේ වෙන කොට මතුවෙමින් තිබෙනවා. එහෙම නම්, අපි අධිකරණය දිහා බලනකොට, අධිකරණයේ ප්‍රතිසංස්කරණ ගැන කථා කරන කොට අධිකරණය මීට වඩා ජනතාවාදී අධිකරණයක් බවට පත් විය යුතුයි, කියන ස්ථාවරයේ ඉන්න ඕනෑ. අපි එම ස්ථාවරයේ ඉන්නවා නම්, අපේ අධිකරණය තුළ තිබෙන දේශපාලනමය ගැටලු විසඳීම වෙනුවෙනුත් අපි මැදිහත් විය යුතුයි කියලා මම හිතනවා.

## PTA

මේ දවස්වල ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ගැන සාකච්ඡා කරන නිසා මම කැමැතියි, ඒ පිළිබඳවත් වචන ස්වල්පයක් කථා කරන්න. මෙය ඒ පනත සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් අපේ අවධානයට ගන්නේ නැති කාරණයක්. අපි දන්නවා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ - PTA ප්‍රශ්න රාශියක් තිබෙන බව. එය සංශෝධනය කිරීම හෝ repeal කිරීම පිළිබඳ විශාල සාකච්ඡාවක් අවුරුදු ගණනක් තිස්සේ සමාජය තුළ පවතිනවා. ඇත්තටම මේ වනකොට ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන පිළිබඳව කොහෙත්ම සෑහීමකට පත් වෙන්න බැහැ කියන මතයත් සමාජයේ දැන් තදින් තිබෙනවා. මොකද, යෝජිත සංශෝධන දිහා බලනකොට අපට පෙනෙනවා, ඒවා ඉතා මතුපිටින් බලා කරන සංශෝධන බව. ඒ පනතේ තිබෙන මූලික ගැටලු විසඳීමට එම සංශෝධන කිසිසේත් ප්‍රමාණවත් නැහැ කියන කාරණය අපි අවධාරණය කරනවා.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළින් විශේෂයෙන්ම ස්ත්‍රීන්ට වන බලපෑම ගැන අද මේ වෙලාවේ වචන කිහිපයක් කථා කරන්න මට අවශ්‍යයි. එම පනත යටතේ අත්අඩංගුවට ගෙන සිරකරුවන් හැටියට තබා ගනන්නා ස්ත්‍රීන් වාගේම රඳවාගෙන සිටින සිරකරුවන්ගේ පවුල් පිළිබඳත් විශාල ප්‍රශ්න රාශියක් මතුවෙලා තිබෙනවා. මේ පනත සංශෝධනය කරන කොට ඇත්තටම ඒ පිළිබඳ සංවේදී වීම අවශ්‍යයි. මේ තිබෙන පනත ක්‍රියාත්මක වන විධිය තුළ රැඳවියන් විතරක් නොවෙයි විඳවන්නේ. මේ පනතේ තිබෙන අඩු පාඩු සහ පනතේ තිබෙන ප්‍රශ්න නිසා රැඳවියන්ට සම්බන්ධ පවුල්වලටත් විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන බව අපි දන්නවා.

මේ පනත ගොඩක් වෙලාවට අවභාවිතයට ලක්වෙලා තිබෙන බව අපි දන්නවා. ඉතාම සුළු සැකයක් මත වුණත් PTA එක හරහා පුද්ගලයන් අත්අඩංගුවට අරගෙන අවුරුදු ගණනාවක් සිරභාරයේ තබාගෙන සිටින බව අපි සියලු දෙනා දන්නවා. අපි උදාහරණයක් ගනිමු. සමහර වෙලාවට නොදැනුවත්ම යම්කිසි රැස්වීමකට යෑම කියන කරුණ මත, එහෙම නැත්නම් නොදැනුවත්ව කා එක්ක හෝ සම්බන්ධතාවක් තබා ගැනීමේ සැකය මත පවා පුද්ගලයන් අත්අඩංගුවට අරගෙන අවුරුදු ගණනාවක් සිරභාරයේ තැබූ අවස්ථා කිහිපයක් තිබෙන බව අපි දන්නවා. එය විශේෂයෙන් ඒ රැඳවියන්ගේ පවුල්වලටත් බලපාන අවස්ථා ගොඩක් අපට වාර්තා වෙලා තිබෙනවා. මේ විශේෂ පනත යටතේ අත්අඩංගුවට ගන්නවා කියන්නේ, එය වෙනත් පනත් යටතේ ඇතිවන ප්‍රශ්නවලට වඩා බරපතළ ප්‍රශ්නයක්. ඒ අයට එයින් කැළැලක් ඇති වෙනවා; මුළු පවුලම ප්‍රජාවෙන් ප්‍රතික්ෂේප වෙනවා. ඊට අමතරව, විශේෂයෙන් ත්‍රස්ත විමර්ශන ආයතන හෝ අධිකරණයට සම්බන්ධ වෙනත් පාර්ශ්වද ඒ පවුලේ අයත් සැකකරුවන් ලෙස තමයි සලකන්නේ. බොහෝ වෙලාවට ඒ පවුල් ගැනත් විමර්ශන සිද්ධ වෙනවා. මේ තත්වය අවුරුදු ගණනක් තිස්සේ වර්ධනය වීම තුළින් විශේෂයෙන්ම ඒ පවුල්වල සිටින කාන්තාවන්ට එදිනෙදා කටයුතු කිරීමේදී වුණත් විශාල ප්‍රශ්න ඇතිවී තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා. අපි උදාහරණයක් ගනිමු. පවුල් සම්බන්ධතා මත, සැකකරු ගැන දන්නවාය කියන කාරණය මත මොකක් හෝ දුරස්ථ නෑකමක් තිබීම කියන කාරණය මත පවා අත්අඩංගුවට ගත් අවස්ථා තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම කාන්තාවන් මේ ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා.

තවත් කාරණයක් කියන්න තිබෙනවා. මේ වෙනකොට අපට වාර්තා වෙලා තිබෙන අන්දමට PTA එක යටතේ අත්අඩංගුවට අරගෙන සිටින කාන්තා සිරකරුවන් - රැඳවියන් - අතර සිටින 25 දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ යම්කිසි වෙනත් සැකකරුවෙකු එක්ක තිබෙන සම්බන්ධතාව මත; පවුල් සම්බන්ධතාව මත, එක්කෝ අම්මා වීම, එහෙම නැත්නම් බිරින්දෑ වීම හේතුකොටගෙන PTA එක යටතේ ඒ අය අත්අඩංගුවට අරගෙන තිබෙනවා. අපට දැනට වාර්තා වෙලා තිබෙන අන්දමට එවැනි රැඳවියන් 25 දෙනෙකු විතර ඉන්නවා. ඉතින්, මේවා බරපතළ ප්‍රශ්න. මොකද, ඒ අය නිදහස් වුණත් ඒ ගොල්ලන්ගේ ජීවිත සදාකාලිකව ඉතාම බරපතළ තත්වයකට පත්වෙනවා. අපි දන්නවා, දැන් මේ දවස්වල රැඳවියන් නිදහස් කරමින් යන බව. ඔවුන් නිදහස් වෙන්නේත් යම්කිසි කොන්දේසි යටතේ ඔවුන් පොලිසියට වාර්තා කරන්න ඕනෑ; ඔවුන්ගේ සංචරණයන් සීමා කර තිබෙනවා. රටින් පිටවීම අත්හිටුවා තිබෙනවා.



ඉතාම කුඩා හේතුවක මත PTA එක යටතේ අත්අඩංගුවේ සිටීමෙන් සිදු වූ අපකීර්තිය, ඇප ලැබීමෙන් හා සිරෙන් නිදහස්වීමෙන් පසුවද ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට බලපෑම් කරමින් තිබෙනවා.

## ඌව වෙල්ලස්ස ඉඩම් කොල්ලය

වාසුදේව නානායක්කාර ඇමතිතුමා කිවුවා, මේ වෙලාවේ ආර්ථික ප්‍රශ්න ගැන නොවෙයි, අපි කරන්න පුළුවන් දේ ගැන කථා කළ යුතුයි කියලා. අපි කරන්න පුළුවන් දේ කරන්න ඕනෑ. මම ඒකට එකඟයි. නමුත් මේ රටේ බරපතළ ප්‍රශ්නයකට, බරපතළ අර්බුදයකට අපි මුහුණ දෙන වෙලාවක එළියේ වෙන දේ ගැන කිසිම තැකීමක් නැතුව පාර්ලිමේන්තුව තුළ එක් රැස් වෙලා අපට කතා කරන්න බැහැ. අපට ජනතාව මුණගැසුණාම ඔවුන් මතු කරන ප්‍රශ්න, ඔවුන්ගේ ගැටලු අමතක කරලා වෙන ලෝකෙක ඉඳගෙන මේ ප්‍රශ්න ගැන කථා කරන්න බැහැ. ඒ නිසා මම ඇත්තටම මේ කාරණය කියන්න කැමැතියි. මේ වෙලාවේ අපි විශාල අර්බුදයකට මුහුණ දෙනවා කියන එක සියලු දෙනාම පිළිග න්න නමුත්, අපි පාර්ලිමේන්තුව ඇතුළේ හැසිරෙන්නේ, පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරන්නේ කිසිසේත්ම ඒ අර්බුදයට අදාළ දේවල් නොවෙයි. ඒ වෙනුවට ඉන් බාහිරව තිබෙන කාරණා ගැන අපි එහෙන් මෙහෙන් කතා කරමින් ඉන්නවා. නමුත් ඇත්ත ප්‍රශ්නය පිළිබඳව, මේ වෙලාවේ මුහුණ දෙන බරපතළ ගැටලු පිළිබඳව අපේ මැදිහත්වීම ඉතා සීමිතයි. ඒ අතරතුර, වෙන කොතැනකින් හරි මේ ගැටලු පිළිබඳ තීරණ ගන්නවා; යම් දේවල් සිද්ධ වෙනවා. ඒ වුණාට අපි පාර්ලිමේන්තුවේ හැසිරෙන්නේ ඒවා සිද්ධ වෙන්නේ නැහැ වාගේයි.

ඇත්ත ප්‍රශ්නය පිළිබඳව, මේ වෙලාවේ මුහුණ දෙන බරපතළ ගැටලු පිළිබඳව අපේ මැදිහත්වීම ඉතා සීමිතයි. ඒ අතරතුර, වෙන කොතැනකින් හරි මේ ගැටලු පිළිබඳ තීරණ ගන්නවා; යම් දේවල් සිද්ධ වෙනවා. ඒ වුණාට අපි පාර්ලිමේන්තුවේ හැසිරෙන්නේ ඒවා සිද්ධ වෙන්නේ නැහැ වාගේයි.

ඇත්තටම අද වෙනකොට ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ අක්කර 65,000ක් විනාශ කරමින් යනවා. ඒක ගැන පාර්ලිමේන්තුවේ වත්, කොහේවත් කිසිම කතාබහක් සිද්ධ වන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ තිබුණු "ගම සමඟ පිළිසඳර" වැඩසටහනේදී ජනාධිපතිතුමාට කියලා තිබෙනවා, ඒ පළාතේ ඉන්න ගොවීන්ට ඒ ප්‍රදේශයේ වගා කරන්න ඉඩ දෙන්න කියලා. වගා කරන්න ඔවුන්ට අවසර දෙන්න කියලා එතුමා නියෝග කර තිබෙනවා. ඒ නියෝගය මත ඒ ප්‍රදේශයේ ගොවීන් මේ ඉතා දුෂ්කර කාලය තුළ, පොහොර ප්‍රශ්න තිබියදීත් පොහොරවලට අධික වියදමක් දරමින් ඒ ඉඩම්වල වගා කර තිබෙනවා. හිටි හැටියේ නිලධාරීන් පිරිසක් ඇවිල්ලා උසාවි නියෝගය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා ඒ වගා බිම් විනාශ කරලා, ඒ සංවේදී කලාපය තුළ විශාල විනාශයක් කරමින් යනවා. උසාවි නියෝග යක් එක්ක තමයි ඔවුන් එන්නේ. ඒ උසාවි නියෝගය බලනකොට පෙනෙනවා, ඒ කටයුත්ත කරන්න යම්කිසි කාලයක් දීලා තිබෙන බව. ඒ අනුව, දෙසැම්බර් මාසයේ තමයි ඒක සිද්ධ වෙන්න ඕනෑ. මේ මිනිස්සු වගා කරලා, අස්වැන්නවත් නෙළන්න ඉස්සෙල්ලා මේ විධියට ඇවිල්ලා, මේ භූමිය විනාශ කරනවා. ඇත්තටම හිතක් පපුවක් තිබෙන මනුස්සයෙක් කොහොමද ඒක කරන්නේ ?

ආර්ථික අර්බුදය ගැන කතා කරනකොට, මේ වෙලාවේ තිබෙන ආර්ථික අර්බුදයේ විශාල බරක් දරන්නේ මේ රටේ දුප්පත්ම මිනිස්සු. ඒකට වන්දි ගෙවන්න වෙලා තිබෙන්නේ දුප්පත්ම මිනිස්සුන්ට. ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග තමයි විනාශ වෙමින් යන්නේ. ඔවුන්ට තිබෙන ආදායම තමයි එන්න එන්නම අඩු වෙන්නේ. බඩු මිල වැඩිවීම නිසා අඩුකරමින් පෝෂ්‍යදායී ආහාර වේලක්වත් ලබා ගන්න බැරිව අමාරුවෙන් තමයි ඒ අය ජීවත් වෙන්නේ. ආර්ථික අර්බුදය විසඳන්න කියලා මේ ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගවල ප්‍රතිවිපාක විඳින්නත් සිද්ධ වෙලා තිබෙන්නේ ඒ ජනතාවටයි. එක පැත්තකින් ගොවි ජනතාවට පොහොරවලින් ගහනවා. ඉඩම් විකිණීම තුළින් තව පැත්තකින් ගහනවා. අඩුම තරමින් ඒ ගොවීන් වගා කරපු අස්වැන්න නෙළා ගන්න ඉඩ දෙන්නේ නැති තත්වයක් ඌව වෙල්ලස්ස පළාත් දැන් නිර්මාණය වෙමින් යනවා. මොක්ද මේ කරන්නේ? අපි මේක සාධාරණීකරණය කරන්නේ මොන පදනමකින්ද? ආණ්ඩුවකට තිබෙන ප්‍රධාන වගකීම ඇති හැකි අය ආරක්ෂා කිරීම විතරක් නොවෙයි. රටේ සියලු ප්‍රජාව සහ විශේෂයෙන්ම අවදානම් සහිත ප්‍රජව යම්කිසි විධියකට ආරක්ෂා කළ යුතුයි.

## EPF අධිභාර බද්ද

ඊළඟට අපි අනිවාර්යයනේම කථා කරන්න ඕනෑ. මේ පනවන්න යන අධිභාර බද්ද පිළිබඳව. මේක තිබෙන පනතක අර්ථකථනයක් එක්ක තමයි මෙහෙම සිද්ධ වන්නේ කියනවා. නමුත් ඒ ගැන අපට සාධාරණ සැකයක් තිබෙනවා. චුට්ටක් හිතලා බලන්න. EPF එකේ income එකෙන් taxable income එක 2019 වසරේ රුපියල් බිලියන 250ට සියයට 25ක බද්දක් අය කරනවා කියන්නේ, ඒකෙන් රුපියල් බිලියන 65ක් විතර ආණ්ඩුවට ලබා ගන්න පුළුවන්. ආණ්ඩුව ඉදිරිපත් කළ අයවැය යෝජනාවේ තිබුණේ, මේ අධිභාර බද්දෙන් බලාපොරොත්තු වන්නේ බිලියන 100ක් උපයා ගැනීම බවයි. එතකොට, ඒ රුපියල් බිලියන 100න් රුපියල් බිලියන 65ක් ගන්න හදන්නේ EPF එකෙන්ද? EPF කියන්නේ trust fund එකක්. මේක වැඩකරන මිනිසුන්ගේ ඉතිරි කිරීම් ආයෝජනය

11 වැනි පිටුවට

# පොලිටිකල් පංතිය

ළමයි පංතියට ඇවිත් පොලිටික්ක පරක්කු හින්ද එළියට බහින්න දොර ගාවට පෙළ ගැහුණ විතරයි මෙන්න පොලිටික්ක කොරිඩෝව දිගේ එනවා, ඇස් රතුවෙලා ඉදිමිලා.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය දොරෙන් එබිල කිවුවා.

"වෙරි ගුඩ් මෝනිං සර්" අනුරුද්දියත් ළඟ ළඟම කිවුවෙ දෝංකාරෙ වගේ.

"ආයුබොවන් ළමයිනේ" පොලිටික්කා හම් මල්ල මේසෙ උඩ තියල පුටුවට වැටුණ.

"සර් හොඳටම මහන්සියෙන් වගේ. ඇස් ගොරකා වෙලා... නිදි මැරුවද" මංජුව බැලූ බැල්මට පේන සාක්ෂිවලින් උපකල්පනයක් කළා.

"ඔවුනෙ ළමයො... ඊයෙ රෑ මට හරියට නින්ද ගියේ නෑ. සැරෙන් සැරේ ඇහැරුණා" පොලිටික්ක ඇස් පොඩි කළා.

"ඇයි සර් නින්ද ගියේ නැත්තෙ. ළඟ ගෙදරක තොවිලයක්ද? පිරිතක්ද?" චමිය කිවුවෙ බෙරේ ගහනව පෙන්නන ගමන්.

"නෑ ළමයිනේ මං මහ නපුරු හීනයක් දැක්ක. සැරින් සැරේ ඒක පේනකොට. ඇහැරුණා" පොලිටික්ක තාමත් බයේද මන්ද වටපිට බලනවා.

"මොකද්ද සර් හීනෙ. ඔය තරම් බයවෙන්න. හොල්මන්ද? යක්කුද?" මංජුව ඇහුවෙ අපිත් බයවෙන්න ඕනැද කියන්න වගේ.

"හොල්මන් යක්කු නම් ඇත්ත නෙමෙයිනෙ. මේකේ වුණේ මිනිස්සු කන්න නැතුව එකාට එකා මරා ගත්ත... කඩවලට කඩා පැන්න... ලොරි නවත්තල කොල්ලකෑවා... ගිනි තිබ්බ... මිනිස්සු මැරිල වැටෙනවා... එක ගිනි විජ්ජුම්බරයයි" පොලිටික්ක කියන්නෙත් ඇස් පියවෙලා ආපහු පේන්න පටන් ගනී කියල බයේ.

"යක්කු දැක්ක වගේ නෙමෙයි... ඇත්තටම සර් එකටනම් බය වෙනව තමයි" කනිය අත දිහා බැලුවෙ මවිල් කෙලින් වෙලාද කියල බලන ගමන්.

"දැන් යන විදිහත් එක්ක හිතනකොට නේද බයක් දැනෙන්නෙ?" සමන ඇහුවෙ පොලිටික්කගෙන්ම නෙමෙයි... පොදුවෙ.

"නැහැ එහෙම බයක් නෑ ළමයිනේ... ගෝඨාභය ජනාධිපතිතුමා එදා රැස්වීමෙදි පොරොන්දු වුණානෙ මේ අවුරුදු දෙක මඟඇරුණාට ඉස්සරහ අවුරුදු තුන ඇතුළෙ සෞභාග්‍යය ගේනව කියල" පොලිටික්ක වමට සිග්නල් දාලා දකුණට කැපුව.

"ඔව්... ඔව් ගෝඨා සර් කිවුව පෝර ඇතත් නැතත් ගොවියගෙ ආදායම නග්ගනව කියලා" සමනත් ඒ පැත්තටම තල්ලුවක් දැම්මම පොලිටික්කට හෙන හැපි.

"අන්න සමන්ට තේරුණා. ජනාධිපතිතුමා කිවුවොත් ඉතින්..." පොලිටික්කට කතාව ඉවරකරන්න හම්බ වුණේ නෑ, මංජුව පැන්න.

"ඒකම තමයි සර් බය... ගෝඨා සර්ව කවුරුහරි ලොකුවටම අන්දනව. දැක්කනෙ නැත්නම් අවුරුදු දෙකකට කලින් දීපු පෝරවලින් තාම තේ ගස් දළු දානව කියන්නෙ නෑනෙ. අනෙක එයා කී තැනකට පැන්නද මාධ්‍ය අරන්. ඒත් මොකුත් වුණේ නෑනෙ. මතකයිනෙ හාල් කඩේට පැනල ගණන් අඩු කරන්න ගියා. අන්තිමට බඩුවල මිල පාලනෙත් අහෝසි කරලා තමයි නතර වුණේ" මංජුව එක ළඟ ඩෑෂ් පාරක් ගහල සමන දිහා බැලුව.

"සර්ට මතකද දන්නෑ. ගෝඨාභය මහත්තය පහුගිය දවසක ලංකාවෙ ව්‍යාපාරිකයො කැඳෝල කිවුව. බය නැතුව ආයෝජනය කරන්න මං බලාගන්නම් කියල... අනේ දැන් ඒ ව්‍යාපාරිකයින්ට අයෝජනය කරන්න හොඳම වටපිටාව හැදිල තියෙන්නෙ... පැය හතහමාරක් ලයිට් කැපෙනව. වාහනවලට තෙල් නෑ. ගත්තු බඩු ගේන්න විදිහක් නෑ. හදපු බඩු ගෙනියන්න විදිහක් නෑ. පිටරටින් මැෂින් ගේන්න බෑ. අමුද්‍රව්‍ය ගේන්න බෑ. දැන් එයලා කියනව සර් තමයි හොඳටම කරල තියෙන්නෙ කියලා. කරල විතරක් නෙමෙයි ඉස්සරහට හොඳටම කරන්නෙත් එයා තමයි කියල... ඊළඟට තව අවුරුදු තුනකින් සල්ගාදු ගිහින් ටක්කෙටම කියනවා. යුක්රේන් යුද්දෙ නිසා මට තවත් අවුරුදු තුනක් නැතිවුණා. ඊළඟ සැරේ දිනුවට පස්සෙ තමයි හොඳටම කරන්නෙ කියල" සමන තල් අත්තට බොරළු ගහන අතරෙ පොලිටික්ක හීන් සීරුවෙ කැන්ටිමට දිරාමාරු වුණා.

## කවුළුව හැරමි තබමි

# උපුටා ගැනීමක්



මාක්ස් ලියූ "ප්‍රංශයේ පංති සටන් - 1848-1850 තෙක්" නම් කෘතියේ පෙරවදනින් පහත සඳහන් කොටස අප මෙහි උපුටා පළ කිරීමට සිතුවේ එහි ඇති කාලීන වැදගත්කම නිසාමය.

"වර්තමානය දක්වා සියලු විප්ලවලවල ප්‍රතිඵලය වී ඇත්තේ එක්තරා නිශ්චිත පංති පාලනයක් වෙනුවට අනෙකක් ඇති වීමය. එහෙත් මේ දක්වා සිටි සියලු පාලක පංති පාලන ජන සමූහය සමග සසඳා බලන කළ, හුදෙක් පුංචි අඩු පිරිසක්ම වී ඇත. මෙසේ එක් පාලක අඩු පිරිසක් පෙරළා දමනු ලැබීය. වෙන අඩු පිරිසක් රාජ්‍යයේ සුක්කානම අල්ලා ගෙන තමාගේ ඵල ප්‍රයෝජනවලට ගැලපෙන ලෙස රාජ්‍ය යන්ත්‍රය නැවත හැඩ ගැසුවේය. මේ පිරිස හැම අවස්ථාවකම ආර්ථික වර්ධනයේ එක්තරා නිශ්චිත ප්‍රමාණයක් විසින් පාලනයට සුදුස්සෙකු බවට පත් කරන ලද සහ කැඳවන ලද අඩු පිරිසම විය. ඒ හේතුව නිසාම පමණක්ම පාලන වැඩි පිරිස කලින් කී කොටසේ යහපත පිණිස විප්ලවයට සහභාගී වීම හෝ නැතිනම් එහි ලා අක්‍රියාත්මක ලෙස ඉවසීම කරබාගෙන සිටීම හෝ සිදුවිය. එහෙත් අපි එක් එක් අවස්ථාවෙහි අඩංගු දේ නොතකා හැරිය හොත් මේ සියලු විප්ලවවල පොදු ස්වරූපය වූයේ ඒවා අඩු පිරිස් විප්ලව වීමය. වැඩි පිරිස සහභාගි වූ විට පවා එය එසේ කළේ දැන දැනම හෝ නොදැන අඩු පිරිසට සේවය කරමින් පමණකි. එහෙත් මේ නිසා නැතහොත් වැඩි පිරිසේ අක්‍රියශීලී අවිරෝධ ආකල්පය නිසා මේ අඩු පිරිස මුළු මහත් ජනතාවගේ නියෝජනය වීමේ විලාශය අත්කර ගත්තේය."

# කුසගින්නේ සිරකරුවන් නැගිට්ට දා...



මාර්තු 18 උදේ පාන්දර පැරිස් නගරය. එදා නගරය අවදි වූයේ කොමියුනයට ජයවේවා! කියමින් කම්කරු ජනතාව ගිගුම් නද දෙමින් පැවැත් වූ ජයඝෝෂා හඬිනි.

1871 මාර්තු 18 යනු ලෝකයේ ප්‍රථම වතාවට කම්කරු ජනතා මැදිහත් වී රාජ්‍ය බලය අත්හදා බැලූ ලොව පුරා ප්‍රකට වූ දිනයයි. එම සිදුවීමට මේ මාර්තුවලට අවුරුදු 151ක් සම්පූර්ණ වේ. පැරිස් නගරයේ බලයගත් කම්කරු ජනතාව විසින් ප්‍රථම වරට එහි නිර්ධන පංති පාලනයක්ද ස්ථාපිත කරනු ලැබීය. කම්කරු බලය පැවතුණේ දින 72ක් පමණි. සතුරා ප්‍රතිප්‍රහාර එල්ල කොට පීඩිත ජනයා ඔවුන්ගේ දරුවන්ද දස දහස් ගණනක් මරා දමා පැරිස් කොමියුනය බිඳ දමා එය පරාජය කර දමන ලදී. මාක්ස් විසින් ප්‍රංශයේ සිවිල් යුද්ධය නමැති අනභිබවනීය කෘතිය සම්පාදනය කරන ලද්දේද ලොව ප්‍රථම නිර්ධන පන්ති රාජ්‍යයට උපහාරයක් පිණිස සහ එයින් උගත යුතු පාඩම් ලෝක නිර්ධන පන්ති ව්‍යාපාරයට පෙන්වා දෙමිනි.

"එක් පංතියක වුවමනාවට තනා නිමකොට තිබෙන රාජ්‍ය යන්ත්‍රය එලෙසම අල්ලාගෙන තම අභිප්‍රාය සඳහා පරිහරණය කිරීමට කම්කරු පංතියට නොහැකිය" යන යාවත් කාලීන වූ නියාමය මාක්ස් ඉදිරි පත් කළේද පැරිස් කොමියුනයේ අත්දැකීම් මුල්කොට ගෙනය.

නිර්ධන පන්තියේ රණ ගීය බවට පත් ජාත්‍යන්තර ගීතය බිහි වූයේද පැරිස් කොමියුනය තුළිනි. ප්‍රංශ කම්කරු පවුලක උපන් සිය 13වැනි වියේදීම කම්කරුවෙකු වූ ඉයුජින් පොටියර් (1816-1887) විසින් මෙය රචනා කර ඇත. ඔහු සටන්කාමී කවියෙකුද විය.

ලොව මුල්ම නිර්ධන පංති රාජ්‍ය බලය අත්හදා බැලූ පැරිස් කොමියුනයට උපහාර පිණිස එහි මුල්පදවැල් අපි මෙහි පළ කරමු.

"නැගිටිව් කුසගින්නේ සිරකරුවනි!
නැගිටිව් මිහිතලයේ අසරණයිනි!
යුක්තිය ඉරණම ගුගුරනවා
ලොවක් වඩා හොඳ බිහිවෙනවා
බැහැ අප බඳිනට තවත් ඉතින්
යදමට පෙර සිරගේ
නැගිටිව් වහලුනි තවත් ඉතින්
නොසිටිව් වහල් බවේ!"

# හූවෙන් දෙන සංඥාව

පාලකයන් කරන කියන බොරු ඉදිරියේ නොනැගිටින්නේ මළවුන්ය. ජීවමාන මිනිසුන් නම් අවදි විය යුතුමය. පාලකයන් කරන බොරුව ඉදිරියේ ජීවත් වූවත් අවදි නොවී සිටින මිනිසුන් හැඳින්වීමට ඔබ කැමති වදනක් යොදාගන්න.

මේ සියල්ලටම වඩා බරපතළ කාරණය වන්නේ පාලකයන් කියන හැම ගොන් කථාවකටම ලවක් දෙවක් නැතිව අත්පුඩි තලන හුරේ දමන පිරිසක් රටක ජීවත්වීමය.

කලෙක රාජපක්ෂලා කියන කරන හැම දෙයකටම විචාරයක් නැතිව හුරේ දමන ජනතාවක් අපේ රටේද සිටියෝය. එහෙත් වැඩිකල් නොයාම දැන් දැන් එම තත්වය වෙනස් වෙමින් තිබෙනු පෙනේ. එය නම් සමාජයට සුභ පෙර නිමිත්තක් වන්නේමය.

සල්ගාදු පිටියට ප්‍රෝඩාවෙන් ගෙනා ජනතාව ඉදිරියේ ජනාධිපති මලයා සහ අගමැති අයියා කටේ තොලේ නොගෑවී බොරු දෙසාබාන හැටි නොඉවසූ ජනතාව "බොරු කථා එපා අපිට පොහොර දියෝ" කියා කෑ ගැසූහ. එහිදී ජනාධිපති මලයා සුපුරුදු පිස්සුව තදවී කීවේ පොහොර ඇතිව හෝ නැතිව අපි ගොවි ජනතාවගේ ආදායම ඉහළ නංවන බවය. මේවා 'ලෙඩා මලත් බඩ සුද්දයි' වගේ කතාය. ළඟදී තේ ගොවියන් හමු වූ ජනාධිපතිවරයා "අවුරුදු 2ක් අපි නොමිලේ පොහොර දුන්නා. ඉතිං තේ අස්වැන්න අඩුවෙන්න විදිහක් නැහැ" කියාය. රැස්ව සිටි තේ ගොවියෝ "බොරු කියන්න



එපා සර්" කියා උත්තර දුන්නෝය. මේ ජනාධිපතිවරයා සිතා සිටින්නේ අවුරුදු දෙකක් පොහොර දුන් පසු සදාකාලිකවම අස්වැන්න නෙළන්න හැකි යැයි කියාය.

යන යන තැන හත් පොළේ වසුරු තවරා ගන්නා අයියා මලෝ පුතු සෙට් එකක් දොරටු පාලකයා රජ වූ දවසවත් අප නම් අසා නැත.

දැන් "අපි ඔක්කොම මේ පාර දෙන්නේ ජ.වි.පෙ.ට" යැයි යුව රජු නාමල් කුමරුගේ මුහුණටම කීමට තරම් ජනතාව එඩිතර වී ඇත. මේවා නම් රටේ ළඟ ළඟ එන මහා සමාජ පර්වර්තනයක් ගැන සුබ පෙරනිමිතිය. දැන් දැන් ආපසු මේ දේශපාලුවෝ යන යන තැන ජනතාවගේ 'හූ' සංග්‍රහවලට ලක්වෙමින් සිටිති.

රුමේනියාවේ ආඥාදායක පාලකයෙකුද අවසානයේ ගෙදර යැව්වේ හූවෙන් පටන් ගත් ජනතාව බවද මතක් කර දිය යුතුය.

## මේ පෙළගැසෙමින්...

2 පිටුවෙන්



කරන්නේ නැහැ.

ඇතැම් මාධ්‍ය පසුගිය ජනාධිපති මැතිවරණ සමයේ මොනවද නොකළේ. කැළණි විහාරයෙන් නයි මතුකරපු මාධ්‍ය ආයතන තිබුණා. ජනතාව ඕනෑම මොහොතක රැවටිය හැකි බවට මාන්නයක් ඒගොල්ලන්ට තිබෙනවා. සතුරා බලවත් බව අපි දන්නවා. ධනය, බලය, මාධ්‍යය සහ ජනතාව රවටන්න පුළුවන් කියන මතය ඒගොල්ලන්ට තිබෙනවා. ඒ සියල්ලට වඩා ප්‍රබල මහජන බලය අපි පෙළගස්වමින් ඉන්නවා. අපි ගැන අපි අධිතක්සේරුවක නැහැ. ඒ වගේම සතුරා ගැන අවතක්සේරුවකත් නැහැ. ජේ.වී.පී. එක අධිතක්සේරුවක ඉන්න බව සමහර අය කියන්න හදනවා. අපි ගැන වගේම සතුරා ගැනත් අපිට නිවැරදි තක්සේරුවක් තිබෙනවා. අපි මේ වැඩේට අත ගැහුවේ ආගමික නායකයන්, වෘත්තීය සමිති, ව්‍යාපාරික ප්‍රජාව, විශ්වවිද්‍යාල ආචාර්යවරු, නීතිඥවරුන් ඇතුළුව ලංකාවේ මෙතෙක් ගොඩනැගී තිබෙන විශාලතම ජනතා ව්‍යාපාරය ගොඩනඟලයි. ඕනෑම සතුරෙක් එක්ක සටන් කරන්න පුළුවන් මහා ජන බලවේගයක් ගොඩනගන්න ඕනෑ. අපි විසිරිලා, හුදකලා වෙලා හරියන්නේ නැහැ. මේ රට වෙනස් කිරීම සඳහා ඕනෑකම තිබෙන අදූෂිත කණ්ඩායම් අපිත් එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ සියලු දෙනාට අපි ආරාධනා කරනවා, ගෞරවය සහ අභිමානය තිබෙන මවුබිමක් හදන්න එකතු වෙනන් කියලා. ඒ වෙනුවෙන් එකතු වෙන්න කැමති අදූෂිත සියලු දෙනාට තම තමන් ඉන්න පක්ෂවලට ආයුබෝවන් කියලා එන්න ජාතික ජන බලවේගය ගොඩනගා තිබෙනවා. අපි යන මාවත තේරුම් ගෙන දස දහස් සංඛ්‍යාත ජනතාවක් තංගල්ල නගරයට එකතුවී තිබෙනවා. ඔබලා අපිට ශක්තිය ධෛර්යය ගෙන ඒම ගැන ස්තුතියි.

ඒ වගේම අපි ගමේත්, නගරයේ, ජාතික වශයෙනුත් සංවිධානය වෙමු. එකතු වෙමු. මේ පාලනය පලවා හරින්න මහ පාරේ මහා ජන ගඟක් නිර්මාණය කරන්න අපි සූදානම්. ඒ වගේම සටකපට ලෙස ඡන්දය කල්දාන්න නොදී, ආණ්ඩු මාරුවකට ඉඩකඩ ලබා ගැනීම දක්වා ඒ බලවේග අපි සංවිධානය කරනවා. අපි මේ තීන්දුව ගත්තේ බකල් ගගහා යන්න නොවෙයි. ආපසු හැරෙන්න නොවෙයි. සහතික වශයෙන්ම බලය අත්පත් කර ගැනීම සඳහා මහා ජනතා ව්‍යාපාරයක් ගොඩනඟනවා. පන්සලේ, පල්ලියේ, කෝවිලේ ආගමික නායකයන් හමුවී සාකච්ඡා කරන්න. ව්‍යාපාරික මහත්තුරුන් එක්ක සාකච්ඡා කරන්න.

හම්බන්තොට කියන්නේ රාජපක්ෂලාගේ නිජබිම නම්, මේක අපෙත් නිජබිම බව ඔවුන් මතක තබා ගන්න ඕනෑ. ඔවුන් පටන් ගත්තේ මෙතැනින් නම්, රටේ අනික් පුරවැසියන්ට වඩා ඔවුන් පරාජය කරවීමේ වගකීම තිබෙන්නෙත් මේ පුරවැසියන්ට බව අපි විශ්වාස කරනවා. හම්බන්තොට වරිග සභාවක් වෙනුවට මේ රටේ පුරවැසියන්ගේ අයිතින් සුරක්ෂිත කරන වගකීම් අපි අරගෙන තිබෙනවා. අපි පටන් ගත්තේ තංගල්ල නගරයේ සුබදායී රැලියකින්. ඉදිරියේදී නගර ගණනාවක රැලි පවත්වනවා. නව පන්නයේ ආණ්ඩුවක් පිහිටුවීමේ සිතියම අපි සැලසුම් සහගතව දියත් කර තිබෙනවා. මේ ගමන ජයග්‍රහණයෙන් කෙළවර කරන්න, මේ රටේ ජනතාවට සතුටින් සැනසුමෙන් ජීවත්වීමේ රටක් ගොඩනැගීමට මහා ජන ගඟක් සේ එකතුවන සේ හැමදෙනාටම ආරාධනා කරනවා."

## ජනතාව දවාලට...

12 පිටුවෙන්

එයා ඉන්නේ.

පසුගිය කාලයක් තිස්සේ ඩොලර් හිඟය, තෙල් මිල වැඩිවීම වගේම විදුලිය අර්බුදය පිළිබඳව පුරෝකථන තිබුණා. නමුත් මාසයකට වත් දුර දකින්න බැරිකම නිසා මේ තත්වය අතිශය බරපතළ වී තිබෙනවා. විදුලි බල ඇති ගාමිණී ලොකුගේ කියන්නේ තෙල් දුන්නොත් ලයිට් දෙන බවයි. ඛනිජ තෙල් ඇමති ගම්මන්පිල කියන්නේ ඩොලර් දුන්නොත් තෙල් දෙන බවයි. ආණ්ඩුවේ ඇමතිවරු ජනතාවට ප්‍රශ්න කියනවා වෙනුවට උත්තර සොයන්නේ නැහැ. ගෝඨාභය මහත්තයා පූටින්ට, මහතීර් මොහොමඩ්ට, ලී ක්වාන්යූට සමාන කළේ ගම්මන්පිල මහත්තයලා. එහෙම කියපු අය ඒ අයගේ දුක මහජනතාවට කියනවා. නම්බු පිටින් අයින්වෙලා යන්නේ නැතිව ඇමතිකමේ වරප්‍රසාද බුක්ති විඳිමින් ජනතාව මුදලින් නාස්තිකාර ජීවිත ගතකරමින් ඉන්නවා. අපි අවධාරණය කරන්නේ ඇමතිවරු තමන්ගේ වගකීම් බාරගත යුතු බවයි. වගකීමක් නැති, වගවීමක් නැති ජනතාව ගැන නොහිතන දුරදකින්නේ නැති තකතීරු ආණ්ඩුවක් යටතේ මේ වැනි තත්වයක් ඇති වී තිබෙනවා. මේ තත්වයට මෙතෙක් රට පාලනය කළ දෙගොල්ලම වග කියන්න ඕනෑ.

පම්පෝරි කයිවාරු ගහමින් එදාවේල ගත කර ගන්න කරන ක්‍රියාමාර්ග නිසා රට වැටිලා තිබෙන්නේ. සංචාරක ව්‍යාපාරය යම්තම් පණගහගෙන එනකොට තෙල් සහ විදුලිය සම්බන්ධ ප්‍රශ්නය නිසා නැවතත් ඇදගෙන වැටෙනවා. ඒ නිසා ජනතාව බඩගින්නේ තබා රට කළුවරේ තබා, වාහන මඟ නවත්වන ආණ්ඩුවක් බවට පත්වී තිබෙනවා. ඒ නිසා ඔබේ අයිතීන් ඉල්ලා ගන්න සැලැස්මක් දැක්මක් නැති මේ දෙපිරිසම ඉවත් කර, රට හදන්න සමත් පාලනයක් පිහිටුවා ගන්න තීන්දුව ගමු කියන ඉල්ලීම ජනතාවට කරනවා."

## මාධ්‍යවේදී...

12 පිටුවෙන්

ඇත්තෙමු. මෙවැනි බොහෝ සිදුවීම්වලට අදාළ සෘජු වරදකරුවන් හා පිටපස සිට ඔවුන් මෙහෙයවූවන් කිසිදා නීතිය හමුවට ඉදිරිපත් කරනු ලැබුවේද නැත. එහෙත් නීතිය ක්‍රියාත්මක නොවූ එම සිදුවීම් පිටුපස, පැවති පාලනයන්ගේ සබඳතා තිබූ බවට ජනතාව තුළ ඇත්තේ දැඩි විශ්වාසයකි.

එබැවින් පොලිස් පරීක්ෂණ නිසි පරිදි ක්‍රියාත්මක වීමට ඉඩ හරින ලෙසත් මෙම ප්‍රහාරයට සම්බන්ධ වූවන් සියලු දෙනා හඳුනාගෙන නීතිය ඉදිරියට පමුණුවන ලෙසත් ආණ්ඩුවට බලකර සිටින අපි, මෙවැනි බියගුලු ප්‍රහාර හමුවේ නොසැලී සිටින ලෙසත් කිසිදු ආකාරයකින් තමන්ගේ මාධ්‍ය භාවිතයන් අත්නොහරින ලෙසත් සියලු මාධ්‍යවේදීන්ගෙන් දැඩි සහෝදරත්වයෙන් ඉල්ලා සිටිමු.

## ජාතික ජන බලවේගය...

12 පිටුවෙන්

යන්න තියෙන මුදල් හිතමිතුරන්ට බෙදා දෙනවා. නමුත් කම්කරුවාගේ අරමුදලට බදු ගසා කොල්ලකන්න පනත් ගේනවා. රටේ මිනිස්සු නිදාගෙන නැගිටින කොට අලුත් ප්‍රශ්නයක් හදන්න ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. නමුත් මිනිස්සු ආණ්ඩුව හැදුවේ තමන්ගෙ ප්‍රශ්න විසඳගන්නයි. ගෝඨාභය රාජපක්ෂ හා ඔහුගේ ආණ්ඩුව බලයට පත් වෙද්දී කිවුවේ බැඳුම්කර හොරු අල්ලන බවයි. පාස්කු ප්‍රහාරකයින්ට දඬුවම් දෙන බවයි. එක රටක එක නීතියක් ක්‍රියාත්මක කරන බව කිවුවා. ගොවියාට නොමිලේ පොහොර දෙන බව කිවුවා. දරුවන් 60,000ක් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා බව කිවුවා. තරුණයන්ට රැකියා දෙන බව කිවුවා. නීතිය, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන බව කිවුවා.

නමුත් අද රට හැම තැනම තියෙන කතාව ආණ්ඩුව අසාර්ථක වී ඇති බවයි. දැන් අලුත් ආණ්ඩුවක් හැදිය යුතු බව ජනතාව හැම තැනම කියනවා. පහුගිය දෙසැම්බර් 20වැනිදා ජාතික සමුළුව පවත්වා ජාතික ජන බලවේගය රට පුරා දිස්ත්‍රික් සමුළු පවත්වමින් යන්නේ මේ රට ගොඩනගන දිස්ත්‍රික් නායකත්වය පත් කරගනිමින් යන්නේ මේ සිහින දකින මිනිසුන්ගේ සිහින යථාර්ථයක් කිරීම වෙනුවෙනුයි. මේ වේදිකාවේ හොරු, නඩු ඇති මිනිසුන්, ජාවාරම්කාරයින්, තනතුරු වරප්‍රසාද බලාගෙන සිටින මිනිසුන් නැහැ. ඔවුන් මෙහි ඒකරාශි වී සිටින්නේ අනුරාධපුරයේ ජනතාවගේ සිහින සැබෑ කරලීම වෙනුවෙනුයි; මිනිසුන්ට සතුටින් ජීවත් විය හැකි රටක් හදන්නයි. ඒ වෙනුවෙන් සියලු සුදුසුකම් සහිත මිනිසුන් මේ වේදිකාවේ සිටිනවා."

## අර්බුදය හමුවේ...


3 පිටුවෙන්




ඉවත දමා නව දේශපාලනයක් වෙත වහාම ප්‍රවේශ විය යුතුය. දැන් රට තුළ එම වෙනස වේගවත්ව සිදුවෙමින් පවතින බව පෙනේ. තනි පුද්ගලයන්ගේ මැජික් බලය අසමත්ව ඇති බව වටහාගෙන සාමූහික ජනතාවගේ ජන බලයේ වැදගත්කමද වටහා ගෙන එකී ජන බලය වහාම ගොඩනැගීම අද දවසේ අර්බුදයට ඇති එකම විසඳුම බව අපේ ජනතාව වටහා ගත යුතුව ඇත. වර්තමාන ක්‍රමය තුළම හිඳිමින් ම්ලේච්ඡත්වය කරා ආපසු යන්නේද නැත්නම් පවතින ක්‍රමය වෙනස් කරමින් ප්‍රගතිය කරා ඉදිරියට යන්නේද යන දෙකෙන් එකක් තෝරා ගැනීමට ඉතිහාසය විසින් දැන් ජනතාවට බල කරනු ලැබ තිබේ.

## ඉතිහාසයේ...

5 පිටුවෙන්



හොඳ මිනිසුන් හා ගැහැනුන් අතර එවැනි ආත්මාර්ථකාමීන්ට පවතින්න බැහැ කියලත් අපි දන්නවා.

ලෝකය ආපස්සට නොයන බවත්, එය ඉදිරිය කරා, ප්‍රගතිය කරා යන බවත්, ලෝකයේ සමාජයේ ඉදිරි ගමන වැළැක්විය නොහැකි බවත් ඉතිහාසයේ රෝදය ආපසු කරකැවිය නොහැකි බවත් අපි දැඩිව විශ්වාස කරනවා. කුමක් වුවත් අවසානයේ ජනතාව ජයග්‍රහණය කරන බව විශ්වාස කරන අප ඒ මත සිට පුළුල්තම හා විශාලතම මහජන ව්‍යාපාරය ලෙස ජාතික ජන බලවේගය

ගොඩනැගීමටත්, එහිදී එන අභියෝග ජය ගැනීමටත්, අවසානයේ ජනතාවගේ පාලනයක් ගොඩ නැගීමටත් අධිෂ්ඨානය හා කැපවීම සහිතව කටයුතු කරනවා. ලස්සන ජීවිතයක් සුන්දර රටක් පැහැබර අනාගතයක් ප්‍රාර්ථනා කරන හැමදෙනාටම අප සමග අත්වැල් බැඳගන්නා ලෙස අපි ආරාධනා කරනවා.

## අඳුරේ ගිලෙන ආර්ථිකය

7 පිටුවෙන්



විදේශ වත්කම් පැවැතියේ ඩොලර් මිලියන 500ක් පමණි.

### IMF යාම නොයාම

දැන් පිරිසක් යෝජනා කරන්නේ පැරණි අයිඑම්එෆ් වට්ටෝරුව වැළඳ ගැනීම ආර්ථිකයේ ගොඩයන තාවකාලික විසඳුම ලෙසය. එයද උත්තරයකි. නමුත් එවිට සිදුවිය හැක්කේ දැන් ආර්ථිකයට, රටට සිදුවෙමින් පවතින විනාශයට තවත් විනාශයක් එකතුවීම පමණි.

පාලකයින් ජනතාවට වැදි බණ දෙසමින් රට විකිණීමට හා හොරා කෑමට පිඹුරුපත් සකසමින් සිටින්නේ අනුකම්පා විරහිතවය. ජනතාව දවල්ට පොලිමේ, රෑට කරුවලේ සිටියෙදී ඇමති කෙහෙලියගේ හිඟ ලයිට් බිල රුපියල් එක්කෝටි විසිලක්ෂයක් ඉක්ම වීමෙන් නාස්තියේ දූෂණයේ තරම පෙනේ. වළකට වැටීම මොළයට හොඳ යැයි කියමනක් තිබේ. නමුත් වත්මන් දිරාපත් වන ධනවාදය කර තබාගෙන යන ලාංකේය ධනපති පාලකයින් නම් වළකට නොව ප්‍රපාතයකට වැටීමෙන් වුවද ඉගෙන නොගන්නා බව තේරුම් ගැනීමට මෙයටත් වඩා අත්දැකීම ලබාදෙන කාලයක් තවත් නැත.

අඳුරේ ගිලෙන ආර්ථිකයත්, කඩා වැටෙන ජන ජීවිතයත් නඟා සිටුවන නව පන්නයේ පාලනයක් බිහි කිරීම පමා කළ නොහැකි සමාජයේ හැමගේම වගකීම බවට පත්ව ඇත්තේ එබැවිනි.

## ආර්ථික අර්බුදයේ..

9 පිටුවෙන්



කරලා, ඒ ගොල්ලන් වෙනුවෙන් රැකබලා ගත යුතු fund එකක්. අයවැය විවාදයේදී මේ Surcharge Tax එක ගැන මුදල් ඇමතිතුමා කිවුවේ, මේක ඉහළ ආදායම් ලබන ව්‍යාපාරවලින් ගන්නා ටැක්ස් එකක් කියලායි. නමුත් ඒ රුපියල් බිලියන 100න් රුපියල් බිලියන 65ක්ම ගන්නේ වැඩකරන ජනතාවගේ මුදල්වලින් නම්, අනෙක් ව්‍යාපාරවලින් ගන්න තිබෙන්නේ රුපියල් බිලියන 30ක් - 35ක් විතර. එතකොට නැවත වතාවක් වැඩකරන ජනතාවගෙන් බදු ගන්නවා. අපි ඒ ගොල්ලන්ගෙන් කී වතාවක් බදු ගන්නවාද? ඒ නිසා ඇත්තටම අපට සාධාරණ සැකයක් තිබෙනවා. මේ මුළු plan එකම කළේ මේ EPF එකේ මුදල් කොල්ලකන්නද කියලා.

මේක නොදැනුවත්ව කළ වැඩක් කියලා අපට හිතන්න බැහැනේ. EPF එකේ කොච්චර ආදායමක් තිබෙනවාද? සියයට 25ක tax එකක් ගැහුවොත්, ඒකෙන් කොච්චර ප්‍රමාණයක් ගන්න පුළුවන්ද කියන එක මුදල් ඇමතිතුමා නොදැනුවත්ව කළාය කියලා අපට හිතන්න බැහැ. ඒ නිසා මෙහෙම කරන එක ඉතාම අසාධාරණයි. මහන්සි වෙලා වැඩකරන ජනතාව එකතු කළ මේ ස්ලලි ටික තමයි කවදා හරි විශ්‍රාම ගියාම ඔවුන්ට ගන්න තිබෙන්නේ. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ සහ semi-govement sector එකේ වැඩ කරන මිනිස්සු හම්බ කරපු මුදල්වලින් තමයි මේ fund එක හදලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ඔවුන්ගේ පඩියෙනුත් tax අය කරනවා. දැන් retirement fund එකෙනුත් Tax අය කරනවා. දෙපාරක් tax අය කරනවා. කොහොමටත් එතැන සියයට 14ක tax එකක් තිබෙනවා. ඒකට මේ සියයට 25ත් එකතු කළාම සියයට 39ක් tax අය වෙනවා. ඉතින් කොච්චර අසාධාරණද? ඒ නිසා මේක මේ නොදැනුවත්කමින් සිද්ධ වුණු දෙයක්. අහඹුවක්, අර්ථකථනයේ තිබෙන ප්‍රශ්නයක් කියන එක නම් අපට පිළිගන්න බැහැ. එච්චර විශාල මුදලක් නම් ඒ tax එකෙන් ලබා ගන්නේ එහෙම නම් ඒ ගැන නොදැනුවත් වීම මුදල් ඇමතිතුමාගේ නොහැකියාව පිළිබඳ ප්‍රකාශනයක්, එතුමාගේ නිලධාරීන් සහ එතුමාගේ නොහැකියාව පිළිබඳ indication එකක් මිසක්, මේක අහම්බයකින් සිද්ධ වූ එකක් කියලා අපට නම් කිසිසේත් භාර ගන්න බැහැ. ඒ නිසා මේ Surcharge Tax එක EPF එකට බලපාන්න අපි කිසිසේත්ම ඉඩ තියන්නේ නැහැ කියන කාරණය අවධාරණය කරනවා.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ජනතාව දවාලට පෝලිමේ - රෑට කළුවරේ! මිල වැඩි නොකර ජනතාවට තෙල් - විදුලිය අඛණ්ඩව දෙන්න



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

මේ වන විට තෙල් සහ විදුලිය අර්බුදයක් නිර්මාණය වී ඇති බවත් මෙය ක්‍රමිකව වර්ධනය වූ තත්වයක් නමුත් ආණ්ඩුව විසඳුම් නොදුන් නිසා ජනතාව දැඩි පීඩාවකට පත්වී සිටින බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, තෙල් හිඟය හේතුවෙන් ජනතාවට දිවා කාලයේ තෙල් පෝලිම්වල සිටීමටත් රාත්‍රියේ විදුලිය නොමැතිව කළුවරේ සිටීමටත් සිදු වී ඇති බැවින් පම්පෝරි කතා නවතා තෙල් මිල වැඩිනොකර විදුලිය සහ තෙල් අඛණ්ඩව ලබාදී ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලන ලෙස ආණ්ඩුවට බල කරන බව ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 24වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ටිල්වින් සහෝදරයා මෙසේද පැවසීය.

"උසස් පෙළ විභාගයට පාඩම් කරන දරුවන්, රැකියා සඳහා ගොස් නිවසට පැමිණෙන්නන් ඇතුළු සාමාන්‍ය ජන ජීවිතය මත දැවැන්ත පීඩනයක් ඇති කර තිබෙනවා. මේ නිසා ජනතාව ජීවත් වෙන්න අරගල කරනවා වෙනුවට දවාලට පෝලිමේ ඉන්නවා, රෑට කරුවලේ ඉන්නවා. මේක සාමාන්‍ය තත්වයක් නොවෙයි. ජනතාව මත ඉතාමත්ම පීඩාකාරී තත්වයක් පටවලා තිබෙන අවස්ථාවක්. ආණ්ඩුවේ නායකයෝ මේ සම්බන්ධයෙන් කිසිම වගකීමකින් කටයුතු කරන්නේ නැහැ. හැමදේම කරන්න පුළුවන් කියලා, දුරදකින නායකයෙක් කියලා ජනතාවගෙන් විශාල ජන වරමක් ඉල්ලා සිටියා. විධායක ජනාධිපති ධුරයත්, තුනෙන් දෙකේ පාර්ලිමේන්තු බලයත්, විසිවැනි සංශෝධනය සම්මත කරගෙන ලබාගත් බලයත් සියල්ල තිබෙද්දී අද ආණ්ඩුවක් නැති තත්වයට පත්වෙලා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට තෙල් නැතිවීම, භාණ්ඩ හිඟවීම, ලයිට් කැපීම ප්‍රශ්න වෙලා නැහැ. එයා ජීවත්වෙන ලෝකයේ කාබනික වගාවෙන් ඉතාමත්ම සරුසාර අස්වැන්නක් ගන්න හීනයක ඉන්නේ. අවුරුදු දෙකකට ඉස්සර යෙදූ පොහොරවලින් අදටත් දළු නෙළන්න පුළුවන් කියන මතයක

11 වැනි පිටුවට

## රට පුරා සමුළු හා සාකච්ඡා සභා මුළුදී






















# මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට එල්ල කරන ලද බියගුලු ප්‍රහාරය හෙළා දකිමු!



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම්
**විජිත හේරත් සහෝදරයා**

පසුගිය 14වැනි දින අලුයම ආයුධ සන්නද්ධ නාඳුනන කණ්ඩායමක් විසින් මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම මහතාගේ නිවසට එල්ල කරන ලද ප්‍රහාර හෙළා දකිමින් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, විසින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී. එම නිවේදනයේ මෙසේ සඳහන්ය.

පිලියන්දල, වැවල පෞද්ගලික නිවාස සංකීර්ණයක පිහිටි මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම මහතාගේ නිවසට අද (14) අලුයම නාඳුනන කණ්ඩායමක් විසින් ගල් හා අසූචි ප්‍රහාරයක් එල්ල කර තිබේ. සුදු පැහැති වෑන් රථයකින් පැමිණි පිරිසක් මෙම පිරිස නිවාස සංකීර්ණයේ ආරක්ෂක නිලධාරියාගේ හිසට පිස්තෝලයක් තබා දොරටුව බලහත්කාරයෙන් විවෘත කරවා ගෙන ඇතුල් වී මෙම ප්‍රහාරය එල්ල කර ඇති බව පැවසේ.

ශ්‍රී ලංකාවේ දේශපාලනය ආශ්‍රිත සිදුවීම් පිළිබඳව ආන්දෝලනාත්මක ජනමාධ්‍ය වැඩසටහන් සිදුකරන මාධ්‍යවේදියෙකු වන චමුදිත සමරවික්‍රම මහතාගේ නිවසට එල්ල කරන ලද මෙම බියගුලු ප්‍රහාරය ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩිව හෙළා දකිමු. ඔහුගේ සමාජ මාධ්‍ය රූපවාහිනී වැඩසටහන් හේතුවෙන් ආණ්ඩුවට සම්බන්ධ දූෂිත දේශපාලකයින් මෙන්ම ඊට සම්බන්ධ කළු ව්‍යාපාරිකයින්ද විශාල ලෙස සමාජය හමුවේ නිරාවරණය වෙමින් තිබූ තත්වයක් තුළ මෙම ප්‍රහාරය ඔහුගේ මාධ්‍ය භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස හා එම ක්‍රියාවලියට අදාළ බියගැන්වීමක් ලෙස සිදු කර ඇති බව පැහැදිලිය. විශේෂයෙන් අගනුවර ආශ්‍රිත ප්‍රදේශයක ආරක්ෂාවද සපයා තිබූ නිවාස සංකීර්ණයකට ආයුධ සන්නද්ධව ඇතුල් වී මෙවැනි ප්‍රහාරයක් එල්ල කර පලා යාමට හැකියාව ලැබී ඇත්තේ මේ පැමිණි කණ්ඩායම පිටුපස බලවත් සබඳතා සහිත පිරිස් සිටි නිසා බවට සැකයක් නැත. විශේෂයෙන් ආරක්ෂක සේවා සපයන මුවාවෙන් ආණ්ඩුව විසින් සන්නද්ධ කණ්ඩායම් නඩත්තු කරමින් සිටින තත්වයක් තුළ මෙවැනි සිදුවීම් අතිශය බරපතළය.

මෙවැනි තත්වයක් තුළ මෙම නින්දිත ප්‍රහාරයේ වගකීමෙන් නිදහස් වීමට කිසිසේත් ආණ්ඩුවට නොහැකි බව අවධාරණය කරන අපි, මෙම සිදුවීමට සම්බන්ධ සියලු දෙනාට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස ආණ්ඩුවට බල කර සිටිමු. මාධ්‍යවේදීන් බිය ගන්වා, තර්ජනය කර සත්‍යය යටපත් කරලීමෙන් තමන්ගේ බලය සදාකාලික කර ගැනීමට කිසිදු පාලකයෙකුට හැකි වූයේ නැත. ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන තර්ජනයට හා ප්‍රහාරයට ලක් වූ අවස්ථා ගණනාවක් අපි දැක

11 වැනි පිටුවට

# ජාතික ජන බලවේගය වටා එක්වී සිටින්නේ අනාගතය ගැන සුබ සිහින දකින මිනිසුන්



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික, ජවිපෙ මධ්‍යම කාරක සභික
**වසන්ත සමරසිංහ සහෝදරයා**

ඉතිහාසයේ මුතුන් මිත්තන්ගේ ආඩම්බරය රැගෙන අනාගතයේ දරුවන්ට සිහිනයෙන් දකින ලෝකය ලබා දීමේ වගකීම වැඩිහිටි පරම්පරාව හමුවේ තිබෙන බවත් ජාතික ජන බලවේගයේ වේදිකාව මතත් ඒ වටාත් එක් රොක් වී සිටින්නේ රටේ අනාගතය ගැන සුබ සිහින දකින මිනිසුන් බවත් ප්‍රකාශ කළ ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වසන්ත සමරසිංහ සහෝදරයා, එම සිහින යථාර්ථයක් බවට පත් කර, බිඳවැටුණු මව්බිම ගොඩනැගීම වෙනුවෙන් පණ පෙවිය හැකි නායකත්වයක් අනුරාධපුරයේ ජනතාව විසින් තෝරා ගෙන ඇති බව කියා සිටියේය.

වසන්ත සමරසිංහ සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 13වැනි දින ජාතික ජන බලවේගයේ අනුරාධපුර දිස්ත්‍රික් සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ වසන්ත සමරසිංහ සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"ජනතාවට හැමදාම ඡන්දයෙන් පසු ඉතිරි වූයේ රැවටීම පිළිබඳ කලකිරීම පමණයි. ආණ්ඩුව ගොවියාට පහර දී ගොවිතැන විනාශ කර තිබෙන මොහොතක අද වැඩබිමේ සිටින කම්කරුවාට පහර දී ඔහුගේ අරමුදල් කොල්ලකන්න හදනවා. ජාවාරම්කාරයින් නඩුවලින් නිදහස් වෙමින් ඉන්නවා. භාණ්ඩාගාරයට

11 වැනි පිටුවට

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.